
# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය

## විපක්ෂයේ බලය එක්සත් ජනතා නිදහස් සන්ධානයට



පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයන්ගේ වැඩිම නියෝජනය වෙනුවෙන් විපක්ෂ නායක ධූරය මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථානායක විසින් පිරිනැමුනි.

එසේම විපක්ෂ සංවිධායක ධූරයට මහින්ද අමරවීර මැතිතුමාට ප්‍රධානය කෙරුණ අතර ඒ වෙනුවෙන් අප සුභපතන්නෙමු.

දක්ශිණාංශික බලයක් ගෙන ඒමට කටයුතු කල ටි.එන්.ඒ, ජ.වි.පෙ, යු.එන්.පි හා මුස්ලිම් පක්ෂ විරෝධය නොතකා විපක්ෂ නායක ධූරය මහින්ද මහාතාට පිරිනමන ලදී.

තැපැල් කාර්යාලය ලියාපදිංචි කරන ලදි : QD/34/NEWS/2018

වෙළුම : 16 කලාපය : 09 අන්තර්ජාල ලිපිනය : www.shakthiya.org 2018 දෙසැම්බර් මිල රු. 30.00

# ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් ජනමතය නියෝජනය නොවේ

# මහ මැතිවරණයක් සඳහා ජන සටන පෙරටම!



## පොදු සතුරාට එරෙහිව අපි මෛත්‍රී සමඟ කටයුතු කරනවා

**හිටපු ජනපති මහින්ද රාජපක්ෂ**

■ **ජයසූරිය උඩුකුඹුර**

ශ්‍රේෂ්ඨාධිකරණයටද කොලේ වසමින් එජාපය දහනවවන සංශෝධනය සම්මත කරගත් ආකාරයට රට බෙදෙන පෙඩරල් ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට තිබූ ඉඩකඩ පසුගිය ඔක්තෝම්බර් 26 වැනිදා ඇතිවූ බල පෙරළියෙන් වැළකී ගොස් ඇති බව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සඳහන් කරයි. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසු පෙරේදා (14) ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයින් 2 පිටුවට

## මැතිවරණ ගැන එජාපය යළිත් බොරු කියන්න පටන්ගෙන

**පා.ම. ඩලස් අලහප්පෙරුම**

■ **සරත් පද්මදාස**



මෙදෙ මළ ජාතික සන්ධානය සමඟ ආණ්ඩුවක් පිහිටු වීමෙන් ඇතිවන ජන අප්‍රසාදය වලක්වා ගැනීම සඳහා එ.ජා.ප.ය නැවත මහ මැතිවරණය ගැන කියමින් ජනතාව නොමග යැවීමේ උත්සාහයක නිරත වන බව එක්සත් ජනතා නිදහස් සන්ධානය චෝදනා කරයි.

එම සංවිධානය පෙන්වා දෙන්නේ අධිකරණ ශාලාව හරහා දිනා ගත නොහැකි වූ මහ මැතිවරණය දිනා ගැනීමට තවත් බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග ඇති බැවින් ඒ සියල්ල ක්‍රියාත්මක කර හෝ මහා මැතිවරණයක් දිනා ගැනීමට කටයුතු කරන බවද දැක්විය. 2 පිටුවට

■ **ජයසූරිය උඩුකුඹුර**

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුව මගින් ජනමතය නියෝජනය නොවන නිසා මහා මැතිවරණයක් දිනාගැනීමේ ජනතා අරගලයට තවදුරටත් ශක්තිය ලබාදිය යුතු බව එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහන් කරයි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් ජනපතිගේ තීන්දුව බල රහිත කලද, ජනතා අපේක්ෂාවන් සමගින් බලපෑමක් සිදුව නොමැති බවද, ඔවුහු පෙන්වා දෙති. මහා මැතිවරණයක් නොපැවැත්විය යුතු බවට අධිකරණ තීන්දුවක් දී නැත. ඒ අනුව මහා මැතිවරණයක් ඉල්ලා ජනතා සටන බලවත් කල යුතුය. ඒ සඳහා මෛත්‍රී, මහින්ද ගේ නායකත්වය ගොඩනැගෙන පොදු ජන සන්ධානය මහා මැතිවරණයක් දිනා 2 පිටුවට

## රනිල් අරලියගහ මන්දිරයේ සිටි කාලයේ දිවා, රෑ කෑම ප්‍රබල තානාපති කාර්යාලයකින්?



■ **බුද්ධිශාන් ජයසිංහ**

ඔක්තෝබර් 26 වනදා ඇති වූ රාජ්‍යය පෙරළියත් සමඟ එජාප නායක රනිල් වික්‍රමසිංහ අවස්ථා කීපයකදීම විදෙස් තානාපතිවරුන් හමු වූ බව පසුගිය දිනවල මාධ්‍ය වාර්තා කර තිබුණේය. මෙම තානාපති හමුවීමෙන් පසුව විදෙස් මාධ්‍ය මෙන්ම විදේශීය ඇතැම් රාජ්‍ය නායකයින්ද ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය පිළිබඳව විවිධ ප්‍රකාශ නිකුත් 2 පිටුවට



# ශක්තිය

49/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/දුරකථන : 0112684820
විද්‍යුත් තැපෑල: shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org


# කතු වැකිය

## දක්ෂිනාංශික කඳවුරේ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රයට නොරැවටෙමු

මධ්‍යතන ලෝකය අභිබවා නව ලෝකයක් මතු වුවද එයද අභිබවමින් නවීනත්වයක් ජය ගන්නා යුගයක් එළිදැක්වෙමින් ඇත. පැරණි ලෝකයේ පැවති දුක් ගැහැට බොහොමයක් නව ලෝකය තුල දැකිය නොහැකිය. මිනිස් සංහතිය සුගතිය කරා ගමන් කරන බව පෙන්නුම් කලත්, ලෝකය පුරා ඇති නැති පරතරය දිනෙන් දිනම පුලුල් වෙමින් දුගී බවින්, යුද බියෙන්, දුක් කඳුලින් ලේ දහරින් බොහෝ කලාප තෙත් වෙමින් තිබේ. තාක්ෂණික නවීනත්වය මුල්වී ස්වාභාවික සම්පත්වලට දැරිය හැකි ආකාරයකින් සාධාරණව හා යුක්ති සහගතව සියලු දෙනා බෙදාහදා ගන්නා ජයග්‍රාහී ලොවක් බිහි කළ නොහැකි වුවහොත් මිනිස් සංහතියම අඳුරු අනාගතයකට පියමං කරනු ඇත.

ලොව පුරා සිදු වන වර්ධනයන් අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්කම් වටහා ගැනීම අපහසු නොවේ. මූල්‍ය සම්පත් හැසිරවීමෙන් නවීන තාක්ෂනය ජවගැන්වීමත් සමග, සම්පත් හිමිකාරිත්වය පවුල් කීපයකට ඒකරාශී වෙමින් තිබේ. නිෂ්පාදන ක්‍රියාවලියේ සිට පාරිභෝජනය දක්වා සියලු හැසිරවීම්ද එයට අනුගාමීව සිදු කිරීමට කොන්දේසි පනවයි. සම්පත් හිමිකාරිත්වයේ දඩබිම වන්නේ විවෘත වෙළඳ පොලයි. ඔවුන්ට ශ්‍රී ලාංකික දූපත වෙළඳ පොලකි. එහි විකුණුම් භාණ්ඩ වී ඇත්තේ ඉඩකඩම්, ස්වභාවික සම්පත් හා උපන් හා නූපන් දරු පරම්පරාවන් ඇතුලු ජනතාවය. එනිසා අද පවතින ගැටුමේ ස්වරූපය වන්නේ දූපතේ හිමිකාරිත්ව ස්වදේශිකයින්ටද එසේත් නොමැතිනම් විදේශික හවුල්කාරි ජාලගත කලමනාකරණ පැලැන්තියකටද යන්නය. මේ යුගයේ ලෝක බලවතුන්ගේ ක්‍රියාමාර්ගය වී ඇත්තේ ඔවුගේ රටවලට සම්පත් ඇද ගැනීම සඳහා විවෘත වෙලඳ පොල න්‍යාය මතින් ණය රාජ්‍යයන් ගොඩනැගීමට හා එම හිමිකාරත්වය මත ජනතාගේ ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට ඇබ ගැසීමය.

වසර තුනහමාරක් තිස්සේ ජනතාවගේ පොදු දේපොල සොරා ගනිමින් ද මහබැංකුව, අර්ථසාධක අරමුදල, ලංකා බැංකුවේ තැන්පතුද කොල්ලකමින් ද, සහනාධාර කපා දමා බදු පිට බදු පනවමින් ද රටට මහත් විපතක් කල හොර දෙටුවෙක් වූ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා නායකත්වය දුන් කණ්ඩායම ජනාධිපතිවරයා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක ප්‍රධාන මොලකරුවෙකු වීමේ සැකයද ඉස්මතුවීම නිසා සිරිසේන - රනිල් ආණ්ඩු සන්ධානය දෙකඩ විය. ජනතාවගේ සටන්කාමී අකලංක නායකයෙක් වන මහින්ද රාජපක්ෂ මහතා වෙත ජනධිපතිවරයාගේ සහෘදත්වයේ දෑත් දිගුවන්නේ පැරනි කොන්තර සියල්ල අමතක කරමිනි. ඒ අනුව මහින්ද මහතාගේ අගමැතිත්වයෙන් යුත් ජනතවාදී ආණ්ඩුවක් පිහිටුවා ගැනුනි. ඉතාම කෙටිකලක් ඇතුලත ජනතාව පීඩාවට පත්කළ නව ලිබරල් ගමන් මාවත හරවමින් සුභසාධනවාදී ආර්ථික පියවරයන් ගැනුනි.

ජනතාව වෙත සහන ගලායාම ඇරඹීමත් සමඟ මූල්‍ය ප්‍රාග්ධනයේ හිමිකරුවෝ කුපිත වූහ. ඔවුහු වහාම ක්‍රියාත්මක වෙමින් හිටපු අගමැති රනිල් සමඟ එක්ව සියලු සම්ප්‍රදායන් පසෙක තබා, නිල නිවස භාර නොදෙමින් බලහත්කාරයෙන් එය මූරකඳවුරක් කර ගනිමින් ජනතා නායකත්වයට අභියෝග එල්ල කරන්නට විය. එමගින් පිටරැටියන් සමඟ එකවී පොදු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය වැලලූහ. එතැන සිට සිරිකොතේ සම්ප්‍රදායට ගරු කරමින් කරුණාරත්න මහතා කථානායක කාර්යභාරය විකෘති කරමින් වලං කඩයට කඩාවැදුනු පිංගොනෙක් මෙන් පාර්ලිමේන්තුවේ සියලු සම්ප්‍රදායන් කෙලෙසුවේය. එම ඒකපාක්ෂික යූ.ඇන්.පී., ටී.එන්.ඒ, ජ.වි.පෙ. මු.කො. දෙවර්ගයේ රංගණයන් ජනතාවගේ සිතුවිලි අවුල් කරන ආකාරයෙන් නවීන තාක්ෂණයේ පිහිටෙන් සජීවීව එළිදැක්විය. එම වටපිටාවද උසාවියේ උගත් විනිසුරුවන්ගේ මතයේ ඒකමතිත්වයටද හේතු වූවා වියහැකිය.

බහුතර ජනතාව දෙගොඩ බෙදී සිටින්නේ සුභසාධනවාදී, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වෙනුවෙන් මහින්ද හා මෛත්‍රී නායකත්වය සමඟ මහ ඡන්දයකට ගමන් කිරීම සඳහා ජය ධජ ලෙලවමිනි. අනිත් පසින් නව ලිබරල්වාදයේ ජාත්‍යන්තර හොර දෙටුවන් සමඟ ආසියානු කලාපයේ ප්‍රධාන මෙහෙයුම්කරු වු රනිල් සමඟ සම්බන්ධන්, ජ.වි.පෙ., මුස්ලිම් පක්ෂ දෙකේ කොන්ග්‍රස්වරු හා කටමැද දොඩවන කේවට්ටයන් කීපදෙනාද ඔවුන්ගේ අනුගාමිකයින්ද විදේශ මුදල් මත යැපෙන කුක්කන්ද එකට පෙලගැසී සිටිති. රනිල්ට අගමැතිකම උදුරා දුන්නේ ජනතාවගේ පොදු දේපොලක් වූ දූපත කෑලි කඩා විකුණා දැමීමට සෑරසෙන පරගැත්තන්ය. එබැවින් දක්ෂිනාංශික බල කඳවුරේ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රයේ රැවැට්ටීම ඉදිරි පරපුරට වටහා දීම අප සැමගේ යුතුකම හා කාර්යභාරයවේ.

# ඇමරිකානු හමුදාව සිරියාවෙන් පසුබසී



## විදෙස් පුවත්

▪ බුද්ධිශාන් ජයසිංහ

සිරියාවෙන් ඇමෙරිකන් හමුදා මුළුමනින්ම ඉවත් කර ගන්නවා යැයි ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පැවැසුවත්, සිරියානු යුද්ධය තවමත් අවසන් වී නැත. ඇමෙරිකා හමුදා සිරියාවට ගොස් අයි.එස්.එස්. හෙවත් ඉස්ලාමික් රාජ්‍ය ත්‍රස්තවාදීන් සමඟ යුද වැදුණේ කුර්දි සටන්කාමීන් සහ සිරියානු ප්‍රජාතන්ත්‍රවාදී බල ඇණිය යන නමින් හැඳින්වෙන වෙනත් සන්නද්ධ කණ්ඩායම් එක් කර ගනිමිනි. ඔවුන්ද සිරියානු රජයට විරුද්ධව සටන් කරන ආයුධ සන්නද්ධ පිරිස්ය.

ඇමෙරිකා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තීරණය කළ ආකාරයට, ඇමෙරිකා හමුදා සිරියාවෙන් පිටවුණොත්, තමන් අමාරුවේ වැටෙන බව සිරියාවේ කුර්දි සහ අරාබි සටන්කාමීහු පවසති. මොවුන් පමණක් නොව අල් නුස්රා නමින් හැඳින්වෙන අල් කයිඩා ශාඛාවටද උදව් කරනු ලැබුවේ ඇමරිකානු හමුදා විසින් බව දේශපාලන විචාරකයින්ගේ මතයයි.

ඇමරිකානු හමුදා අයි.එස්. එස්. ත්‍රස්තවාදීන් මර්ධනය කරන මුවාවෙන් කුර්දි හා ප්‍රජාතන්ත්‍ර බලඇනිය යන විපක්ෂ සන්නද්ධ කණ්ඩායම් සඳහා ආයුධ ලබා දෙමින් සිරියානු රජයට විරුද්ධව ප්‍රහාර එල්ල කිරීම මෙතෙක් සිදු කරන ලදි. මෙයින් ඇමරිකානු භටයින් මරණයට පත්වන විට ඔවුන්ගේ අඳෝනාවන් ඩොනල් ට්‍රම්ප් ජනපතිට හිසරදයක් විය. එයටත් වඩා ආසන්න හේතු වන්නේ ඇමෙරිකාව තුර්කියට පේට්‍රියොට් මිසයිල 80 ක් හා පී.ඒ.සී. 3 වර්ගයේ මිසයිල 60 ඇමෙරිකන් ඩොලර් බිලියන 3.5 කට විකිනීමේ ආර්ථික ගනුදෙනුව නිසා බව දේශපාලන ආරංචි මාර්ග දන්වයි. තුර්කිය නේටෝ සාමාජික රටක් වුවත් මැදපෙරදිග අර්බුදයත් සමඟ රුසියාව හරහා එක්වීම නිසා මිසයිල් ගනුදෙනුව ගැන නෙටෝවේ විරුද්ධත්වයක්ද මතුව තිබේ.

# පලමු පිටුවෙන්

## ශ්‍රේෂ්ඨාධිකරණ ...

ගැනිමේ සටන නොනවතින බවද එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රකාශකයකු කිවේය. රටේ බහුතර ජනතාව එ.ජා.පෙ ප්‍රතික්ෂේප කර ඇති බැවින් ජනතා වරමකට ඉඩදී මෙරට රැකගත හැකි දේශප්‍රේමී ආණ්ඩුවක් හදා ගැනිමේ අරගලය ජය ගැනිමට මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සියළු දෙනා එක්ව සමඟිව කටයුතු කල යුතු බව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා පෙන්වා දෙන්නේය.

අධිරාජ්‍යවාදි වුවමනාවන් අනුව එ.ජා.ප.ය ආණ්ඩු පිහිටුවීමට යාම තුල එහි අභ්‍යන්තර ආරවුල් බොහොමයක් ඉස්මතුව ඇති බවද නව ආණ්ඩුවේ ඇමැතිකම් බෙදා ගැනිමේ බලපොරය තුල ඔවුන් පිහිටුවා ගන්න නව ආණ්ඩුවද ඉතා ඉක්මනින් කඩා වැටෙනු ඇති බවද මන්ත්‍රීවරයා සඳහන් කරන්නේය.

## මැතිවරණ ගැන ...

රනිල් වික්‍රමසිංහ අගමැති ලෙස පත්කර පිහිටුවාගන්නා ආණ්ඩුව මැතිවරණ ගැන කතා කිරීම විහිළුවක් බව ද එ.ජා.ප.ය පසුගිය කාලය පුරාවට මැතිවරණ නොතබා මැතිවරණ සිතියම හකුලා ගැනීමට ක්‍රියා කළ බව ද මේ සම්බන්ධයෙන් කරනු ලැබූ විමසීමකදී ඒකාබද්ධ විපක්ෂයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම මහතා සඳහන් කළේය. එ.ජා.ප ආණ්ඩුවක් යටතේ මහ මැතිවරණ පවත්වා ඡන්ද කොල්ලයකට ඔවුන් සූදානම් වන්නේ යයිද චෝදනා කරන ඩලස් මන්ත්‍රීවරයා එවැනි තත්ත්වයක දී වුවද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා ඒකීය ශ්‍රී ලංකාව වෙනුවෙන් ජීවිත පූජාවෙන් කටයුතු කිරීමට මෛත්‍රී, මහින්ද පොදු සන්ධානය සූදානමින් සිටින බව ද පෙන්වා දුන්නේය.

## රනිල් අරලියගහ ...

කරන ආකාරයක් ද දක්නට ලැබුණි.රනිල් වික්‍රමසිංහ අරලියගහ මන්දිරයේ රැදී සිටිමින් මේ සියලු දේ මෙහෙයවද්දී එජාප පාක්ෂිකයන් දිනපතා දිවා රාත්‍රි දෙ-කේම අරලියගහ මන්දිරයේ ලැගුම් ගෙන සිටි-ය්ය. මෙසේ ලැගුම් ගත් පිරිසට දිවා රාත්‍රිය ආහාර සපයා ඇත්තේ ගෝල්ෆේස් හෝටලය හා ටාජ් සමුද්‍රා හෝටලය බවද සඳහන් විය. මෙම හෝටල්වලින් සැපයූ ආහාර සඳහා රුපියල් ලක්ෂ ගණනක බිල්පත් ගෙවා ඇත්තේ බටහිර ප්‍රබල රාජ්‍යක මෙරට තානාපති කාර්යාලක් බවටද චෝදනා එල්ල වී ඇත. මෙම චෝදනාවේ ඇත්ත නැත්ත එජාපය රටට හෙළි කළ යුතුය. එජාපය නිහඬව සිටියහොත් මෙම චෝදනාවන් සත්‍යයක් ලෙස පිළිගැනීමට ජනතාවට සිදු වනු ඇත.

## පොදු සතුරාට ...

සමඟ පැවති සාකච්ඡාවක දී රාජපක්ෂ මහතා මේ බව සඳහන් කර ඇත. ඒකාබද්ධ විපක්ෂය හා මෛත්‍රිපාල පාර්ශවය අතර පසුගිය කාලයේ ඇතිව තිබූ අනවබෝධය නිසා එජාපයට නීති විරෝධී ක්‍රියා මාර්ගවල නියැලීමට හැකිව තිබුණත් ඉදිරියේදී පොදු සතුරාට එරෙහිව මහින්ද, මෛත්‍රී පාර්ශව දෙක එක් පාර්ශ්වයක් ලෙස කටයුතු කිරීමට ද මෙම සාකච්ඡාවේදී තීරණය කර ඇත. දෙමළ ජාතික සන්ධානය සමග ආණ්ඩුවක් පිහිටුවීම සඳහා එජාපයෙන් ඔහුන්ට ලබා දී ඇති පොරොන්දු පිළිබඳව දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්මලිංගම් සිද්ධාර්ථන් හා ටෙලෝ සංවිධානය හෙළි කර ඇති කරුණු පිළිබඳව රටට හෙළි කළ යුතු බවට බලකිරීමේ යෝජනාවක්ද මෙම සාකච්ඡාවේ දී සම්මත කරගෙන ඇත. ජනාධිපතිවරයා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ද යම් යම් විවේචන තිබුණත් ඉදිරියේ දී ජනාධිපතිවරයා ආරක්ෂා කිරීමටත් ඔහු වෙනුවෙන් පෙනී සිටීමටත් මෙම සාකච්ඡාවේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තීරණය කර ඇත. මේ අතර ඉදිරියේදී පිහිටුවීමට නියමිත ආණ්ඩුව පිළිබඳව ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට ද මෙම සාකච්ඡාවේ දී මහින්ද රාජපක්ෂ මහතා තීන්දු කර තිබේ.

# ජනතාවාදී යුගයක ඇරඹුමට ජාත්‍යන්තර ප්‍රතිගාමිත්වයේ හරස්වීම

**සොබාදහමේ හැසිරීම් බියකරුය. ගියවර ආණ්ඩු මාරුවට පෙර උතුරු මුහුද ආසන්නයේ අවපාත කුනාටුවක ලක්ෂණ පහල විය. එයත් සමඟ ආණ්ඩු වෙනසද දේශපාලන බිමේ සිදු විය. මෙවරද දේශපාලන මාරුවීමට පෙර සිටම නත්තල් කුණාටුව නැගෙනහිර හා උතුරු ප්‍රදේශයේ හානිදායක ආකාරයෙන් හැසිම පිලිබඳ කාලගුන විද්‍යාඥයින් අනාවැකි පලකරමින් සිටී. ගියවර සිදු වූවාට වඩා මෙවර සිදුවීම අනතුරුදායක වියහැකිද? එලෙසම දේශපාලන බිමේද බරපතල තත්වයක් උදාකරන්නේය. එය ජාත්‍යන්තර ප්‍රතිගාමිත්වයේ මැදිහත්වීමෙන් ව්‍යවස්ථාදායක ප්‍රතිවිප්ලවයක් ලෙස දිගහැරුනි.**

## ජනවාර්ගික සාමූහිකත්ව පදනම බිඳ දැමීම

මෛත්‍රී - රනිල් එකමුතුවෙන් ජනවාර්ගික සාමුහිකත්වයක් ගොඩනඟා ගැනීමට වෙහෙසකර උත්සායක් පසුගිය වසර තුනහමාරක් තිස්සේ ගෙන ගියත් එය බොඳවී ගියේ එක් අතකින් දිගන මතු වූ මුස්ලිම් විරෝධී අරගලයයි. තවමත් එහි මූල බීජයන් ගුප්ත ජනකය. මහසොහොන් බලකායේ නිර්මාතෘ අමාත්‍ය මණ්ඩලය තුල සිටි අතර, සිරිසේන ජනපති ඝාතන සැලසුම ගැන සාකච්ඡා හෙලිවූයේ දිගන ක්‍රියාකාරීත්වයත් සමඟ ඇදෙමිනි. ද්‍රවිඩ සන්ධානය බරපතල ලෙස විදේශ බලවේගයන්ට කොටුවීමත්, බටහිර ආධිපත්‍යට යටවීමත් මෛත්‍රීපාල ජනාධිපතිතුමා බලාපොරොත්තු වූ ජාතික සාමුහිකත්වයක් ගොඩනඟා ගැනීමේ අකලංක උත්සාහය පලුදු කලේය. අනිත් අතින් බහුතර ජනතාවගේ උවමනාව පිටු දකිමින් ජාත්‍යන්තර කොල්ලකාරීන්ගේ උවමනාවන් අනුව අන්‍ය ජනවර්ගයන්ගේ පෙලගැසීම ජාතික සාමුහිකත්ව පදනමට පලුද්දක් ඇති කරන්නේය. මහින්ද මහතා ඉවත් කිරීමට යූ.ඇන්.පී., ජ.වි.පෙ. එක පෙලට සිට කටයුතු කිරීම හැමදා සිදුවූ දෙයකි. නමුත් මෙවර දෙ.ජා.ස. හා දෙවර්ගයේ මු.කො.වරුන්ගේ හැසිරීම ලාංකික අනාගතය පිලිබඳව ප්‍රශ්ණගතය.

## කොල්ලකරුවන් නැවතත් රාජ්‍ය බලය ඩැහැගනී


රාජ්‍ය දේපොල සොරාකෑම ගැන වහසිබස් දොඩමින් සෝභිත හිමිනමගේ සාධාරණ සමාජයක් ගොඩනැගීමේ ව්‍යපාරය කොල්ලකා ගත් හපුටු රැල ඇස් පනාපිට මහ බැංකුව කොල්ල කමින්, ජනතාවගේ සම්පත් වූ අර්ථසාධක අරමුදල හා ලංකා බැංකුවේ තැන්පතු අවභාවිතා කරන විට මොවුන්ගේ උගුරේ පිට්ටු හිරවී තිබුනේය. එම හොරමුලේ මහමොලකරු හා ප්‍රධානියා බවට පත්ව සිටින හිටපු අගමැති රනිල් නීතිය ඉදිරියට පමුණනවා වෙනුවට නැවතත් අගමැති තනතුරට පත් කරන ලෙස ඉල්ලා රැස්වීම් පවත්වා සත්‍යග්‍රහ කිරීමද පෙන්නුම් කරන්නේ මොවුන් ලිට්රෝ ගෑස්වලින් පමණක් දුවන පිරිසක් නොව බටහිර තානාපති කාර්යාලවලින් යැපෙන තක්කඩියන් නඩයක් බවය. එම දූෂිත ව්‍යාපාර ජ.වි.පෙ., ටී.එන්.ඒ. හා යූ.ඇන්.පි.යේ අනියම් බලකාය ලෙස රටත් ජනතාවත් විදේශික දංගෙඩියට දක්කාගෙන යාමට පාර කපයි. පිරිමි මිසී ලෙස කුප්‍රකට බටහිර වසුරු බුදින විදේශ අරමුදල් ගුල්ලා මෛත්‍රීපාල ජනාධිපතිවරයා ගඩාපිකරණයට ලක්කළ යුතු බවට වෛරී ප්‍රකාශයක් සිදු කරනු ලැබුවේ රජයේ සේවයේ පොදු අරමුදලින් වැටුප් කඹුරමින් මැදපෙරදිග ජනතාවට අත්කර දුන් ව්‍යසනය මෙම කලාපයේද ඇති කිරීමටය.

## ලංකික රාජ්‍ය අධිරාජ්‍යවාදයේ අත්ගෙඩියක් කිරීම

අවමංගලගේ ඇමරිකානු සැලසුම අනුව ලාංකික රාජ්‍ය ප්‍රතිව්‍යුහ ගත කිරීම පියවර කීපයකින් සන්හිඳියාව නාමයෙන් සිදු කෙරුණ අතර, ඒවා සියල්ල අද වනවිට පත්වී ඇත්තේ ලාංකික රාජ්‍යයේ ස්වාධින පැවැත්ම බිඳ දමමින් දීනත්වයට රට පත් කිරීම බව පසුගිය සිද්ධිදාමයෙන් මොනවට පෙන්නුම් කලේය. ස්වාධීන කොමිෂන් නාමයෙන් පත්කොට ඇති ආයතන ජාත්‍යන්තර උවමනාවට නැටවෙන රූකඩ බවට පත්විය. එය හොඳින් පැහැදිලි වන්නේ මහ මැතිවරණය පැවැත්වීමෙන් තමන්ගේ මානව හිමිකම කඩවන බව මැතිවරණ කොමිෂමේ සාමාජික මහාචාර්ය සභිකයා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම්කරුවෙක් ලෙස ඉදිරිපත්වීමෙන්ය. එබැවින් මැතිවරණ කල් දැමීමේ යූ.ඇන්.පී. න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය ලෙස ස්වාධීන මැතිවරන කොමිෂන් සභාව පත්වූ ආකාරය දැක ගත හැකිය. අනෙකුත් ස්වාධින කොමිෂන් ඇත්තේද ජනතාවගේ පරමාධිපත්‍ය බලයට හතුරුවන ආකාරයකින්ය. ඒකීය රාජ්‍ය බිඳ දමන ව්‍යවස්ථාවක් ලාංකික රාජ්‍යයේ සිරසට ඉහලින් නූලකින් ගැටගසා ඇති අසිපතක් ලෙස එල්ලා වැනෙමින් තිබේ. එයින් සිදුවිය හැකිව ඇත්තේ ජාතික රාජ්‍යය දියකර හැරීමේ බටහිර උවමනාව අනුව ජ.වි.පෙ., ටී.එන්.ඒ.,යූ.ඇන්.පී. හා දෙවර්ගයේ මු.කොන්ග්‍රස්වරු ක්‍රියාත්මකවීමෙන් හා පවතින නීතිරීති නොසලකමින් කථානායකවරයා ඒකාධිපතියෙක් බවට පත් වෙමින් හඬින් ඡන්ද ගැනීම සිදු කළ පසුව එය ශ්‍රේෂ්ඨාධිකරණ පිලිගැනිමක් බවට පත්වීමත් අනුවය.

## ජනාධිපති ක්‍රමය ඉවත්කර පාර්ලිමේන්තුවට බලය

පාර්ලිමේන්තුවට බලය පවරා ගැනීම වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයයි. නමුත් එය සිදු විය යුත්තේ ජේ.ආර්.ගේ ඡන්ද ක්‍රමය හකුලා දැමීමෙන් පසුවය. එවැන්නකට මුල පිරිය හැක්කේ බහුතරයේ කැමැත්ත දිනු වර්තමාන ජනාධිපතිවරයාගේ නායකත්වයෙනි. නමුත් ඔහු කොතෙක් එයට උත්සාහ කළත් රනිල් එයට කිසිදු ඉඩක් නොදුන් අතර, පළාත් පාලන ඡන්දය කොත්තු රොටියක් බවට පත් කර ජනතාවට ගිල්වනු ලැබීය. මෙවර පළාත් සභා ඡන්දයටද එයම සිදු කරමින් සිටී. රනිල් යටතේ මහ මැතිවරණයක් හෝ ජනාධිපතිවරණයක් බලාපොරාත්තු විය නොහැකිය. ඔහු ජේ.ආර්.ටත් වඩා එපිට ගිය බටහිර ගැති ඒකාධිපතියෙකුගේ ලක්ෂණ දැනටමත් පෙන්නුම් කර හමාරය. ඔහුගේ බලාපොරොත්තුව ජනාධිපතිවරයා සතු බලතල කොක්කෙන් හෝ කෙක්කෙන් ලබා ගැනීමය.




## දූෂිතයින්ගේ පාරාදීයකට තාවකාලික ඉඩක්

ඡන්ද නොපවත්වා ජනතාවගේ පරමාධිපත්‍ය බටහිර සැලැස්ම අනුව දියකර හරිමින්, රාජ්‍ය සම්පත් අවභාවිතා කර, මංකොල්ල කමින්, මූල්‍ය දූෂිත රැලක් බවට පත්වූ රනිල්ගේ අගමැති ධූරය බිඳවැටීම ඔහු විසින්ම ගෙලට දමා ගත් තොන්ඩුවක් විය. එනිසා අරලියගහ මැදුරේ බලහත්තකාරයෙන් රැඳී සිටිමින් ව්‍යවස්ථා ප්‍රතිවිප්ලවයක් තුලින් නැවතත් අගමැති ධූරයට රනිල් පත්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ නියමුවෙක් ලෙස නොව බටහිර උවමනාවන් අනුව ලාංකික රාජ්‍යයේ ජනතාව සතු සියලු දේ විදේශිකයින් වෙත ණය උපක්‍රම මගින් 99 අවුරුදු බදු හෝ සින්නක්කරයට විකුණා කොමිස් තමන්ගේ සමාගම්වලට මාරුකර ගන්නා අමනුෂ්‍ය රාක්ෂ අවතාරයක් ලෙසය. විධායකයත් ජනතාවත් තනිවී ව්‍යවස්ථාදායකය හා අධිකරණය පාර්ශවීයව කටයුතු කිරීම නිසා කෙටිකාලීනව දූෂිතයින්ට නැවතත් ඉඩක් මතුවිය.

මෛත්‍රී ජනපති හොර අලි රැනෙන් ගැලවී පණ බේරා ගත්තේ අනූනමයෙනි. අලි - කොටි, වන සතුන් පමණක් නොව අද්භූත බලවේග සමඟද, සොභාදහමේ කටුක අද්දැකීම් සමඟද පොර බදමින් උතුරුමැද පලාතේ පොලොන්නරුව නිජබිමේ ගොවිතැන් බත සරි කරගත් අකලංක ගොවි පුත්‍රයෙකුගේ සිතුම් පැතුම් මෛත්‍රී ජනපති උරුම කර ගත්තේය. එය ඔහුගේ හපන්කමකට වඩා ශ්‍රී ල.නි.ප. සටන්කාමී උරුමයේ හදගැස්මෙන් මතුවූ ජාතිකත්වයේ වීරත්වයකි.

එනිසා ඔහු විසින් ජනතාව වෙත ඉදිරිපත් කරන තියුනු අදහස් ප්‍රතිගාමිත්වයේ හදවත් නුදුනේදී සිදුරු කරනු ඇත. ඒකාබද්ධ විපක්ෂය විසින් එක දිගට වසර තුනහමාරක් තිස්සේ දක්ෂිනාංශික පූට්ටුව පුපුරා යන දිසාවෙන් එල්ල කල කුලුගෙඩි පහරින් එය දෙබෑවී මෛත්‍රී ජනතාවගේ සටන් සගයෙක් බවට පසුගිය ඔක් 26 දා පත් විය. මෙය එක් රැයක් තුල සිදු වූ නිහඬ විප්ලවයකි. එම එකමුතුව මහින්ද - මෛත්‍රී, වාමාංශික හා ප්‍රගතිශීලී ජනබලවේග පුබුදුවන මහා බලයක් බවට පත් කරවන පසුබිමක් නිර්මානය කෙරුනි. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ තනි බලය ජනතාවට ආශිර්වාදයකි. අධිකරණයට අවනතවීම තාවකාලික පසු බැසීමකි.

ජනතා බලයකට බියව කල්පමා කෙරෙමින් පවතින ඒකාබද්ධ කම්කරු සමුළුව වහා කැඳවා වැඩබිම් බලයට දේශපාලන ජවය පනගැන්විය යුතුය. එයත් සමඟ අපගේ කඳවුරේ පළාත් පාලන සභිකයින්ගේ මහ සමුළුව කැඳවා පළාත් සභා ඡන්දය හා මහමැතිවරණය දිනාගැනීමේ අඛණ්ඩ විරෝධතා උද්ඝෝෂණය පෙරට ගත යුතුය. තවදුරටත් දෙගිඩියාවෙන් නොසිට ඒකාබද්ධ විපක්ෂය මහින්ද-මෛත්‍රී නායකත්වයෙන් නව සන්ධානයක් බවට හරවමින් ප්‍රකාශයට පත් කර මහ සමුළුවක් මගින් රට පෙරට ගෙනයන ඉදිරි වැඩපිලිවෙල ජනයාට එලිදැක්විය යුතුය. යූ.ඇන්.පී. මුල්වූ ජනතා ද්‍රෝහී අශුද්ධ සන්ධානය පැරදවීම එකම අරමුණක පිහිටා මෙම කටයුතු ඉටු කලොත් මාස 3ක් වැනි කෙටි කලකදී ප්‍රතිගාමී ආණ්ඩුව බිඳ දමන ජනතාවාදී පාලනයක් පිහිටුවීමේ දිසාවෙන් මැතිවරණ ජයක් අත්කර ගැනීම අරුමයක් නොවනු ඇත.

**■ සිරිසුමන විදානපතිරන**

**2018-12-20**

# ජනතාවගේ

# විධායකය, ව්‍යවස්ථාදායකය ස



## ජනතාවගේ පරමාධිපත්‍යය යහජීවනයයි

**ශ්‍රී ලංකා චීන බෞද්ධ මිත්‍ර පදනමේ සභාපති හිටපු පිරිවෙන් අධ්‍යක්ෂ ජෙනරාල්**
- පූජ්‍ය වලස්වැවේ ඥාණරතන නාහිමි

මෙරටේ පරම අයිතිය වන ජනතාවගේ යහජීවනය ඇති කිරීමට අද රට කරවන අයට නොහැකි වෙලා තියෙනවා. අපේ රටේ බටහිර විදේශික අත පෙවීම වැඩියි. ඔවුන් පාර්ලිමේන්තුවේ පවා ගැලරියේ අසුන් ගෙන නිරීක්ෂණ ආදිය කරන්නේත් මෙම අතපෙවීම් ගැන සොයා බලන්නයි.

මේ රටේ සම්පත් වලින් ප්‍රයෝජන නොගෙන රට දියුණු කරන්න විදෙස් ණය ගැනීම් තුළින් අප රට උගුලකට හසු වෙලා තියෙන්නේ. රටට හිතැති යම් අණපනත් ගෙනාවම බටහිර බලපෑමට එය අගතියක් උනොත් නැවත සංශෝධන ගෙනල්ලා බටහිර පලාකයින් සනසනවා. ඇයි අර ණය නැතිවෙයි කියන බයට.

මෙවැනි ණය උගුල නිසා ආහාර හිඟයක් ඇති උනොත් මුළු රටම සාගින්නෙන් පෙලෙනවා. ඇයි අපේ රටේ කෘෂි නිෂ්පාදන ඇනහිටලා නිසා. එම කෘෂි නිෂ්පාදන වලට බටහිර බහුජාතික සමාගම්වල බලපෑම් එල්ලවෙලා නිසා විදෙස් ණය මතම අපිට යැපෙන්නට සිදු වෙලා තියෙනවා.

මුලින්ම කළ යුත්තේ රටේ අණපනත් සකසා ගත යුතු ක්‍රමවේදය නිසි ලෙස විදේශීය බටහිර රටවලට ගැත්තන් නොවී සිදු කිරීමයි. ඔවුන්ගෙන් යැපෙන්නන් නොවී අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමත්, රටේ ප්‍රමුඛතම කර්මාන්තය වන කෘෂි කර්මාන්තයට ප්‍රමුඛතාවයත් දියයුතුයි. ආහාර, ඇඳුම් පැළඳුම්, සෞඛ්‍ය වැනි කාරණා මුල්කරගෙන ජනතාවට සහන දෙනවා නම් තාක්ෂණික කාරණා නව නිපැයුම් වැනි දේවල් රටට හිතැති ලෙස කොන්දේසි සමඟ ඇතුළත් කොට ජාතික ප්‍රතිපත්තියක් හැදුවොත් මේ රටේ ජනතා පරමාධිපත්‍යය රැකේවි.

විශේෂිතම කාරණය වන්නේ බටහිර රටවල සංස්කෘතිය හා අදහස් ආධාර උපකාර වලට වඩා පෙරදිග ඉන්දියාව චීනය වැනි රටවලින් අපේ රටට ලැබෙන අනුග්‍රහය හා මිතුදම වැඩිදියුණු කර ගැනීමයි. ඒ තුලින් රටට හිතැති විදෙස් ප්‍රතිපත්තියකුත් ලංකාවට ජාතික ප්‍රතිපත්තියකුත් නිර්මාණය කර ගත හැකියි.

## රාජ්‍ය නිලධාරීන් සූදානම් මැතිවරණයට අවශ්‍ය දින 51යි



**මැතිවරණ කොමිෂන් සභාපති**
- මහින්ද දේශප්‍රිය

ලංකාවේ මැතිවරණ වැඩිදියුණු වෙලා තියෙන්නේ පාර්ලිමේන්තුවේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිය අනුවයි. මහජනතාව, පොලීසිය, සිවිල් සංවිධාන, ත්‍රිවිධ හමුදාව, රජයේ නිලධාරීන් ඒ අනුව මැතිවරණ ක්‍රමයට අනුගත වන අතර එය ප්‍රජාතන්ත්‍රවාදීව සිදුකිරීමට ඔවුන් ඉදිරිපත් වේ.

ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලන බලයේ යුතුකම මහජනතාවගේ පරමාධිපත්‍ය සුරැකීමයි. පාර්ලිමේන්තුව තුල බහුතරයකගේ කැමැත්ත තුලින් ඡන්ද අයිතිය පසෙකට දමනවානම් ඒක වැරැද්දක්.

අත්‍යාවශ්‍යයෙන් දින 51 මැතිවරණයකට අවශ්‍යයි. රටේ ව්‍යවස්ථාදායකයටත්, විධායකයටත් නිලධාරීන් ලෙස අපි බැඳී සිටිමු. එවැනි ඉඩකඩක් තුල මැතිවරණයක් පැවැත්වීමට තීරණයක් ගතහොත් කලහැක්කක් නොමැත.

**සැකසුම හා සාකච්ඡාව**
**ජනබන්දු සේනානායක**



## අධිකරණය නොසලකා පාර්ලිමේන්තුව කැඳවීම අත්තනෝමතිකයි



**නීතිඥ**
- ප්‍රේමනාත් සී දොලවත්ත

මා මෙය ව්‍යවස්ථා අර්බුදයක් ලෙස දකින්නේ නෑ. කථානායකවරයා විසින් ඇතිකරපු කොලපාට කණ්නාඩියකින් බැලූ අර්බුදකාරී තත්වය නිසයි මෙසේ සිදුවුනේ. ඔහුගේ කාර්යය විය යුත්තේ ව්‍යස්ථාදායක සභාව සාමාන්‍යයෙන් හැසිරවීමේ බලය පාවිච්චි කිරීමයි. මෙයින් සිදුවුයේ සෘජුවම ජනතා බලය විධායක බලය අතික්‍රමනය කිරීමකි.

78 ව්‍යවස්ථාවේ දී ජේ.ආර්.ජයවර්ධන විසින් විධායකය හඳුන්වාදුන්නේ, පිරිමියෙක් ගැහැණියක් කිරීමට හෝ ගැහැණියක් පිරිමියෙක් කිරීමට පමණක් නොහැකි ව්‍යවස්ථාවක් ලෙසයි. නමුත් කථානායකවරයා විසින් මෙවර කටයුතු කලේ විධායකයට, ව්‍යස්ථාදායකයට හා අධිකරණයට, ප්‍රශ්නගත ලෙසත් අවුල් සහගත ලෙසත් වැඩ කටයුතු කිරීමය.

ගරු ජනාධිපතිතුමා විසින් ගැසට් නිවේදනයකින් පාර්ලිමේන්තුව විසුරුවාහැර මහ මැතිවරණයක් පැවැත්වීම වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කිරීම ප්‍රස්තුත කාරණයක් හැටියට ගෙන එය නවතාලීමේ එක් ක්‍රියාවලියක් ලෙසයි අධිකරණයෙන් තහනම් නියෝගය ලැබෙන්නේ.

මූලික අයිතවාසිකම් නඩුව අසන තුරු පාර්ලිමේන්තුව කැඳවීම, කථානායකවරයා විසින් සිදුකිරීම, විධායකයටත් ව්‍යස්ථාදායකයටත්, අධිකරණයටත්, කල අපහාසයක් හැටියටයි මා දකින්නේ.

එසේම, විපක්ෂය විසින් ජනතා පරමාධිපත්‍ය නොසලකා හරිමින් ඡන්ද බලයට අභියෝග කිරීමක් හැටියටයි මා මෙය දකින්නේ. නිදසුනක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ පවතින ආණ්ඩුව ගෙදර යැවීමට පසුගිය 24 වෙනිදා මහජන උද්ඝෝෂණයක් කල අතර එම 26 වෙනිදා ජනතා පරමාධිපත්‍ය වන ඡන්ද බලය සඳහා මැතිවරණයක් අනවශ්‍ය යැයි කීම පෙන්වා දිය හැකිය.

19 වෙනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව අවුරුදු 4 1/2 ක් ජනාධිපතිවරයාට ආණ්ඩුව විසුරුවීම නොහැකි වන ලෙසත්, පාර්ලිමේන්තුවට වඩා වැඩි බලයක් අගමැතිතුමාට ලබාදීමට කටයුතු කල ව්‍යවස්ථාව හැටියටයි හුවා දක්වන්නේ. නමුත් මෙය හුදෙක්ම එක්සත් ජාතික පක්ෂයට බලය ලබාගැනීමේ සංශෝධනයක් බව පැහැදිලිය. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන 22 ක් ගෙනාවද 19 ක් සංශෝධනය කරගත හැකිවුයේ විධායකයේ තිබූ නිහතමානිත්වය නිසාය.

කෙසේ වෙතත් ගරු ජනාධිපතිතුමාවෙත 19 වෙනි සංශෝධනයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකිබව 33/2 වගන්තිය යටතේ සඳහන්ව තිබෙනවා.

ජනතා පරමාධිපත්‍යයට අධිකරණයට, ව්‍යවස්ථාදායකයට, විධායකයට අභියෝග කිරීමේ හැකියාව කිසිසේත්ම පාර්ලිමේන්තුව හරහා කථානායකවරයාට බලයක් නොමැති බව සඳහන් කරන්නට කැමැත්තෙමි.



## 19 වැනි සංශෝධනය විකෘතියක්

**නීතිඥ**
- සමුද්‍රා එස්. බාලසූරිය

1978 විධායක ජනාධිපති ක්‍රමයේදී මුල්වූ කාරණය වන්නේ සංවර්ණ හා තුලන ක්‍රම වේදයයි. එහි විධායකය හරහා සිදුවූ කාරනා මෙම 19 වෙනි සංශෝධනයේදී බැහැර වූ බවක් පෙනෙන්නට තියෙනවා. 18 වෙනි සංශෝධනයේදී පවා එහි මුලික හරය වෙනස් කිරීමක් සිදුකලේ නැහැ. එම නිසා 19 වෙනි ව්‍යවස්ථාව මගින් රට ඉස්සරහට යන ගමන නැවතුනා. එයට හේතුව එහි විකෘති භාවය නිසායි. මුලිකව අද රට අස්ථාවර භාවයට හේතුව තමයි 19 වෙනි සංශෝධනය.

මේ නිසා ජනතා පරමාධිපත්‍යයට හානි සිදුවෙලා තියෙනවා. එයින් පාර්ලිමේන්තුවට තමයි වැඩි හානියක් සිදුවෙලා තියෙන්නෙ. මොකද රටේ දේපල විකිනීම, අනිසි ගිවිසුම්, පෞද්ගලිකකරණය ආදියෙන් රට බේරාගැනීමේදී විධායකය ඉදිරිපත් නොවීම නිසා තමයි ජනතා පරමාධිපත්‍යයට දැඩි ලෙස හානි සිදුවෙලා තියෙන්නේ. මේ 19 වෙනි සංශෝධනයේ විකෘතිභාවය නිසයි එය සිදුවුයේ.

ඒ වගේමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රට ගැන සිතා හෝ තම මතවාදය ගැන සිතා හෝ නිසි තීන්දු ගැනීමට තීරණ ගැනීමට නොහැකි ලෙස ගැනීමට නොහැකිවීම නිසා සදාචාර සම්පන්න නොවී විදේශිකයන්ගේ අත පෙවීම් සමග ඔවුන් අධික මුදලකට විකිනී යාම වැනි කාරණා හොඳාකාරවම දැක ගනන්ට පුලුවන් විය. එයද ජනතා පරමාධිපත්‍යයට මරු පහරක් වුනු බව සඳහන් කරමි.

රටක නීති පද්ධතිය සකස් කරන්නේ රටේ ස්ථාවර භාවයත්, රටේ ජනතාවගේ උපරිම සුභ සිද්ධියත් සඳහාය. නීතිය පවතින්නට නම් රටකුත්, රටතුල ජනාතාවකුත් සිටිය යුතුයි. එවිටයි ජනතා පරමාධිපත්‍ය රැකෙන්නේ. මේ අනුව බැලූකල 19 වෙනි සංශෝධනයේ විකෘති භාවය හේතුකොට ගෙන ජනතා පරමාධිපත්‍යයට ව්‍යවස්ථාදායකයට, විධායකයට දැඩි ලෙස හානි සිදුවූබව සඳහන් කරන්නට කැමතියි. මෙහිදී ඇති එකම බලාපොරොත්තුව නීතිමය විසඳුමක් පමණයි. ඒ හරහා විධායකය බලවත් කොට සංවර්ණ හා තුලන ක්‍රමය අනුව විධායකයට රට රැක ගැනීමේ අවස්ථාව උදාකර දිය හැකිය. එසේ නොමැති වුවහොත් තීරණ ගතයුතු වන්නේ ජනතාවගේ පරමාධිපත්‍යය බලය විසින්මය.

# පරමාධිපත්‍යය

# ගා අධිකරණ බලසීමාව කුමක්ද?

## නව ලිබරල්වාදී ජීවන පැවැත්ම ආක්‍රමණකාරී



**කොළඹ අගරදගුරු**
- මැල්කම් රංජිත් හිමිපානන්

නිදහසින් පසුව මේ රට පිරිහිලා. නීතිය කඩා වැටිලා තියෙන්නේ. ජාත්‍යන්තර කරණය තුල හැම දේටම විදේශීය රටවල් ඔවුන්ගේ බල පුලුවන් කාරකම් වලින් අපේ රටට ලැජ්ජාවක් නැතිව අතපොවනවා.

අපේ රටතුල ප්‍රශ්න තියෙනවා. ඒවා රට ඇතුලේ විසඳාගත යුතු කාරනා. රටට පිටින් අතපොවන්න නීති රීති පනවන්න, මානව හිමිකම් වෙනුවෙන් කථාකරන්න, ඔවුන්ට සදාචාර අයිතියක් නෑ. සදාම් හුසේන් මැරුවේ, මොහොමඩ් ගඩාෆි මැරුවේ ඔවුන්ගේ මානව හිමිකම් නොසලකා හරිමින් හිතුවක්කාරී ලෙසයි. ඉතින් මේ අය තමයි. අපට මානව හිමිකම් ගැන නීති රීති පණවන්න කටයුතු කරන්නේ.

1978 නව ලිබරල්වාදී ජීවන පැවැත්ම තමා අපේ රටට ඒ ආක්‍රමනකාරීයි තත්වය ගෙනාවේ. මේක අපි වෙනස් කරගත යුතුයි නේද? වැරදි පැත්තට පොදු ජනතාව ප්‍රතිපත්ති මාලාවලින් ඇද ගෙන යනවා. ශ්‍රී ලංකාවට අවශ්‍ය ප්‍රතිපත්ති මාලාවක් හදාගන්න. ඔවුන්ගේ සහජීවනය තුළින් කටයුතු කරන ආණ්ඩුක්‍රමයක් තමයි අවශ්‍ය වන්නේ.

මේ රටේ ඇතිවුනු ධර්මිෂ්ඨ ආණ්ඩුව තමයි අධර්මිෂ්ඨම ආණ්ඩුව වුනේ. අතුරු දහන්වීම් ඒකාලෙ තමයි පටන්ගත්තෙ. ස්වාධීනව විදේශීකත්වයට යට නොවී කටයුතු කලොත්, පාර්ලිමේන්තුවේ සියළු දෙනා එකතුවී ජනතාවගේ ප්‍රශ්න ජනතාවගේ කැමැත්ත අනුව විසඳීමට කටයුතු කලොත්, අනිසි වෙළඳ ගිවිසුම්, රටේ දේපල විකිනීම්, ජනතාවගේ කැමැත්ත අනුව සිදුකෙරේ නම්, විදේශිකයන් බලය අල්ලා සිටීමෙන් ඔවුන් අයිතිකාරයෝ යැයි සිතන තුරු මේ රටේ පාවාදීම් සිදුවන බව දකින්නට පුලුවන්. දේශපාලඥයින් මේ රටේ මුරකාරයන් මිසක අයිතිකාරයන් නොවන බව තේරුම් ගත යුතුයි.

අපට ප්‍රශ්න වලින් මිදී කටයුතු කිරීමට හැකියාව තිබෙනවා. ඒනිසා සමගිය සහ සහජීවනය තුලින් මේ රට ඇතිවී තිබෙන තත්වයට විසඳුම් දීමට ශ්‍රී ලාංකිකයෝ හැටියට අපට ශක්තිය තිබෙනවා.

මේ පැන නැගී ඇති අර්බුදයට යමක් කීමට සිදුව තිබෙන්නේ උසාවිය දෙන තීන්දුව මතයි. ඒ වනතුරු ඊට යමක් කිව නොහැකියි. එතෙක් මේ රටේ පුරවැසියන් ලෙස ආගමික ශිෂ්ටාචාරය හා ආධ්‍යාත්මික ධනවත් බවින් අපි කටයුතු කරමු.

## දේශපාලන ව්‍යුහාත්මක වෙනසක් අවශ්‍යයි



**මහාචාර්ය**
- සුමනසිරි ලියනගේ

මෙය අවුරුදු 40 ක නව ලිබරල්වාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අර්බුදක් පුපුරවායාමක් ලෙසයි මා දකින්නේ. එහෙම නැතිව ජනාධිපති විසින් මෙම අර්බුදය ඇති කරපු දෙයක් නොවෙයි. 1978 ව්‍යවස්ථාවට 19 වෙනි සංශෝධනයෙන් ඇතුලත් කරුණු පරස්පරයන් ලෙසත්, කාලය අනුවත්, මෙම අර්බුදය ඇති වු බව හිතනවා. නමුත් මෙය පුපුරා යාමට හේතු වුයේ, කාලාන්තරයක් කැකෑරුනු අර්බුදයක් පුපුරා යාමකි. ඒ නිසා ලංකාවට නිදහස ලැබුන පසු ලංකා ඉතිහාසයේ මෙතෙක් මුහුණු දුන්නු දැවැන්තම අර්බුදය මෙය කියලා හිතනවා. මෙයට සමාන අර්බුද අප දැකලා තියෙනවා. ව්‍යවස්ථා අර්බුද වගේම, තරුණ කැරලි තුනක්, දෙකක් දකුණිනුත්, එකක් උතුරිනුත් ඇති වුනා. හැබැයි මේ අර්බුද එකක් වත් මේ තරම් ව්‍යුහාත්මක නැහැ. මෙය අවුරුදු 40 ක ව්‍යුහාත්මක ප්‍රශ්නයක් ලෙසයි පවතින්නේ.

ඉතින් ඒ අර්බුදය විසඳන්න ලැබෙන්නේ නැහැ, මේ තත්වය උඩ. පොඩි පොඩි තෙතමාත්තු ඇති කරගන්න පුළුවන්. නමුත් මේ විවාදාත්මක තත්වය මත අද අධිකරණය, ව්‍යවස්ථාව, විධායකය අංජබජල් වෙලා තියෙනවා. ඒනිසා මොන ක්‍රමය කලත් අර්බුදය වැඩිවෙනවා මිසක අඩුවීමට තිබෙන ඉඩකඩ බොහොම අඩුයි.

අපි දැක්කා විධායකයට පාර්ලිමේන්තුව ඇතුලේ තමන්ගේ කටයුතු කරගන්න ඉඩක් නැහැ. ඒක තමයි 19 වෙනි සශෝධනය. නමුත් 78 ව්‍යවස්ථාවේ මේ වගේ අවස්ථාවක ජනාධිපතිතුමාට තිබුනා අර්බුද විසඳන්න අවස්ථාව. දැන් 19 වෙනි සංශෝධනයේ ඒ තත්වය තිබෙන්න පුළුවන්. නමුත් එය අවුල් කරලා තියෙන්නේ. ඒක හරියටම අර්ථ කථනය කරන්නේ කෙසේද කියලා කාටවත් කියන්න බැරි පැටලිලි කාරණයක්.

මීට පෙර මෙවැනි අර්බුදකාරී අවස්ථාවක චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය විසින් අවුරුදු 2 කින් රනිල් වික්‍රමසිංහ එලවනවා අපි දැක්කා. ඒ වගේම පසුගියදා දි.මු.ජයරත්න අගමැතිකමේන් නෙරපනවත් අපි දැක්කා. නමුත් අද මේක අර්බුදකාරී තත්වයකට පත්වෙලා. අපට මේ තත්වය ඇත, කියලා තර්ක කරන්නත් පුළුවන්. නැත, කියලා තර්ක කරන්නත් පුළුවන්. එතකොට විධායක පැත්තෙන් මේ අර්බුදය මෙලෙස තියෙනවා.

ව්‍යාවස්ථාව පැත්තෙන් ගත්තාම ක්‍රියාත්මක වන්නේ ස්ථාවර නීති අණපනත් යටතේ. ව්‍යවස්ථාදායක රාමුවක් යටතේ. එතකොට අද කථානායකවරයාට බැරිවෙලා තියෙනවා සාමාන්‍ය නීති රීති අණපනත් යටතේ ක්‍රියා කරන්න. නව අගමැතිවරයා පත්කිරීම සම්බන්ධව ක්‍රියා කලේ ශෛල්‍ය කර්මයක් කරනවා වාගේය. කකුලක් කපලා ඉවත් කිරීමක් තමා එය සිදුකලේ. ස්ථාවර නියෝග අණපනත් තිබියදී, ව්‍යවස්ථාදායකය තිබියදී, එහි කොටසක් ඉවත්කිරීම තමා සිදුකලේ.

අධිකරණය පැත්තතෙන් ගත්තොත් මෙම ප්‍රශ්නය අවුල් කිරීමට කිසිදු තීරණයක් අරගෙන නෑ. ඒකෙන් පෙනෙන්නේ, විධායකය, ව්‍යාවස්ථාව, අධිකරණය, ව්‍යුහාත්මක විසඳුමක් දීමට හැකියාවක් නොමැති බවයි. මෙය යම්තාක් දුරකට විසඳුමක් දීමට හැක්කේ පාර්ලිමේන්තු මැතිවරණයටක යාමෙන් පමණයි. නමුත් එය සමානුපාතික නියෝජනය ක්‍රමයකින් සමන්විතව, බහුතරයක් තිබුනත් එය යම් ආකාරයකින් මේ තත්වය වෙනස් කිරීමට සිදුවීමේ ප්‍රවණතාවය අඩු බවයි මට හිතෙන්නෙ.

මේ ගැටළුව විසඳීමට සමාජ ක්‍රමයේ වෙනසක් සිදුකිරීමට සිදුවෙනවා. එහෙම නැතිව මේ ව්‍යවස්ථාමය හෝ පුද්ගලහෝ ආචාර ධර්ම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මෙය පැහැදිලිවම දේශපාලන ප්‍රශ්නයක්. මෙයට තිබෙන්නේ දේශපාලන හා ව්‍යුහාත්මක විසඳුමක් විතරයි.

# දිවුරන්න ගිය අගමැතිට ජනපතිගෙන් චෝදනා පත්‍රයක්



2015 ජනවාරි 08 වනදා ජනාධිපතිවරණය, එම අභියෝගාත්මක මැතිවරණ ව්‍යාපාරය තුළ ලැබූ විශිෂ්ට ජයග්‍රහණය තුළ රටේ ජනතාව බලාපොරොත්තු වූ ඔවුන්ගේ අරමුණු හා ප්‍රාර්ථනාවන් සහ සිතුම් පැතුම් රාශියක් තිබුණා.

වසර හතරකට ආසන්න කාලයක් ඉක්ම යමින් තිබෙන මේ අවස්ථාවේ ප්‍රධාන වශයෙන්ම පසුගිය කාලය තුළ අපි රජයක් විදියට ලබාගත් ජයග්‍රහණ හා කරපු හොඳ වැඩ කොටස් රාශියක් තිබෙනවා වගේම ඉතාමත් අවැඩදායකවූ, අසුභ වූත් අවිචාර වූත් සිදුවීම් රාශියක් සිද්ධ වුණා 2015 ජයග්‍රහණයෙන් පස්සේ අමාත්‍ය මණ්ඩලය තෝරන අවස්ථාවේ ඉදලම මම ඔබට ප්‍රකාශ කර ඇති පරිදි අපේ මැතිවරණ ප්‍රකාශයේ ප්‍රතිඥාවන් කඩවුණා. විද්‍යාත්මක පදනමෙන් අමාත්‍යාංශ වෙන්කළයුතුයි කියලා මැතිවරණ ප්‍රකාශයේ තිබුණා. විශේෂඥ කණ්ඩායමක් පත්කරලා ඒ කටයුතු කරගෙන ගිහින් තිබුණා. නමුත් ඒ ලිපි ගොනුවවත් බැලුව ද කියලා මම දන්නේ නැහැ. යහපත් දේවල් ගත්තහම රටේ ප්‍රජාතන්ත්‍රවාදයස්ථාපිත කිරීම,ජනතාවගෙ නිදහස, 19 වන සංශෝධනය, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම, 19 වන සංශෝධනය මම දකින්නේ ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම තුළ ඇති වූ ප්‍රගතියක් විදියට විතරයි. අනිත් පැත්ත මම අද දකින්නේ විශාල දේශපාලන ආරවුලක් විදියටයි.

> **" මම සුදුසුකම් ඇති විනිසුරුවන් අධිකරණයට පත්කරන්න යෝජනා කලත් ව්‍යවස්ථාදයක සභාව ඒ නම ප්‍රතික්ෂේප කලා "**

ඒ වගේම 19 වන සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභා පත් කිරීමේදී වගේම රටේ අනිත් තනතුරුවලට පත් කිරීමේ දී ව්‍යවස්ථාසභාව කොතෙක් දුරට අපක්ෂපාතී වුණා ද, සාධාරණ වුණා ද කියන කාරණය මට නම් ප්‍රශ්නයක්. අද අග්‍රවිනිශ්චයකාරයගේ ඉදලා, නීතිපති, පොලිස්පති ස්වාධීන කොමිෂන් සභා මේ සියල්ල පත්කරන්නේ ව්‍යවස්ථාදායක සභාව. මම දැක්ක ප්‍රධානම දේ තමයි ව්‍යවස්දායක සභාව තුළ අධිකරණයට පත්කිරීම් කිරිමේ දී අධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන්ගේ නම් ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කළහම ඒවා ප්‍රතික්ෂේප වුණා. අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරු පිරිසක් අතරේ මට චෝදනාවක් තිබෙනවා ජ්‍යෙෂ්ඨත්වය අනුව ඒ අයට මම පත්වීම් ලබා දෙන්නේ නැහැ කියලා. මම පැහැදිළිව කියන්න ඕන ඒ චෝදනාවට ලක්වී තිබෙන සෑම නමක්ම මම ව්‍යවස්ථා සභාවට යවලා තිබෙනවා. ව්‍යවස්ථා සභාව ඒවා ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ඒ තුළ අධිකරණයේ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාර ධූර දරන අයට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. අද අග්‍රවිනිශ්චයකාරයගේ ඉදලා, නීතිපති, පොලිස්පති ස්වාධීන කොමිෂන් සභා මේ සියල්ල පත් කරන්නේ ව්‍යවස්ථාදායක සභාව. ඒ නිසා විනිශ්චයකාරවරු පත් කිරීමේ දී ව්‍යවස්ථා සභාව අනුගමනය කරන කියා පිළිවෙත කොතෙක් දුරට සාධාරණ වුණා ද කියන කාරණය මට නම් ප්‍රශ්නයක්. එහිදී මට ඔප්පු කරන්න කරුණු රාශියක් තිබෙනවා.

■ **බුද්ධිශාන් ජයසිංහ**

# කුම්බලා මාළු කෑවානම් දුක විඳවපන් බළලෝ



රනිල්ගේ මාමණ්ඩියා වු ජේ.ආර්. ජයවර්ධනගේ ජනාධිපති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අනුහසින් යු.එන්.පි. යටත්, රනිල්ගේ අගමැති ධූරයටත් අකල් මරණ දෙකක්ම උරුම වුණා. පලමුව චන්ද්‍රිකාගෙනුත්, දෙවනුව මෛත්‍රීගෙනුත් මරණයට පත්වුණා.

1994 දී චන්ද්‍රිකා විධායක බලය පෙන්වා යු.එන්.පී ආණ්ඩුව විසුරුවා හැර රනිල් අගමැතිකමින් පහකලා. ඒ අවස්ථාවේදී ජ.වි.පෙ. පූර්ණ අනුබලය චන්ද්‍රිකාට හිමිවුණා. අනතුරුව ජ.වි.පෙ.ද චන්ද්‍රිකා සමඟ පරිවාස ආණ්ඩුවක් ගොඩනඟාගෙන අනුර කුමාර, ලාල් කාන්ත, විජිත හේරත්, හඳුන්නෙත්ති ඇතුළු නායකයින් ඇමතිකම් හතරක්ද ලබාගෙන, ඇමැති ධුරන්දරවල වැජඹුණා. මේ කෙලිමඩල දැක්ක, ජ.වි.පෙ. කේඩර නායකත්වයෙන් අඩක් පමණ වෙනත් දේශපාලන පක්ෂ වලට සේන්දු වුණා. ඔවුන්ගෙන් සමහරක් ධනපති දේශපාලයට අනුගතවුවා පමණක් නොව පංති සටන සමාජ යාථාර්ථයක් නොවන බවට න්‍යායික කථිකාවක්ද සමාජගත කරමින් සිටියා.

## ජ.වි.පෙ බඩ පිනුම්

2018 ඔක්තෝබර් 26 වැනිදා, මෛත්‍රීපාල ජනාධිපතිතුමා රනිල් අගමැතිකමින් පහකිරිමේදී ජ.වි.පෙ නැවත පිටි අතට බඩපිනුමක් ගසා, ජනාධිපතිතුමා විධායක බලය ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධී, නිතී විරෝධී, ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් බව කියමින් පාර්ලිමේන්තුව තුලත්, රට තුලත් මෛත්‍රීට විරුද්ධව මතවාදයක් ගොඩනඟමින් සිටිනවා. එහිදී ඔවුන් සමාජගත කරන්නේ තමන් අරගල කරන්නේ, මහින්ද හෝ රනිල් අගමැති කරන්න නොවන බවත්, ප්‍රජාතන්ත්‍රවාදය ජයග්‍රහණය කරවීම උදෙසා බවත්ය. එම ඊනියා සටනින් ජයග්‍රහණය හිමිවුයේ යු.එන්.පී.යටයි. එහි අවසන් ප්‍රතිඵලය රනිල් අගමැතිවීමත්, ප්‍රජාතන්ත්‍රවාදය මලගම් යෑමත් බව ජ්.වි.පිය නොදන්නවා නොවේ. මෙවැනි දේශපාලන උප්පරවැට්ටි නොකර ජ්.වි.පි.යට දේශපාලන ඉදිරි දර්ශනයක්ද නැත. ඔවුන්ගේ අරමුණ ඔක්තෝබර් 26 වැනිදාට පෙර පැවැති තත්වය නැවත ඇති කර යු.එන්.පී ය විසින් ලබාදුන් විපක්ෂ සංවිධායකකම නැවත සියතට ගෙන අලුත් නියායක් සුත්‍ර ගතකොට, නිර්ධන පංති දේශහපාලනය තලුමරමින් දේශපාලන කන්‍යාවක් ලෙස පෙනීසිටිමින්ද යු.එන්.පී පාලන බලය හෙබවු වසර තුනහමරක කාලයක තුල මේරටේ ජනතාවගේ ජීවත්විමේ අයිතිය උදුරාගනිමින්, මුල්‍ය ප්‍රග්ධනය ලිබරල් ආර්ථිකයට ගැටගසා ධනපතියන්ට රිසිසේ වෙළෙඳපොළ පාලනය කිරිමට අවස්ථාව උදාකර දුන්නා. මේ අනුව නැවත රනිල් බලගැන්විමෙන් බිහිවන්නේ අනුකම්පා විරහිත මංකොල්ලකාරි රාජ්‍ය පාලනයක්. රනිල් නැවත රාජ්‍ය බලය සියතට ගත් සැනින් ජ.වි.පී. යේ හා සිවිල් සංවිධාන වල දීගය හමාරකොට සිය පංති උවමනාව මත ඊනියා ප්‍රජාතන්ත්‍රවාදීන්ට පයින් ගසා සිය ඓතිහාසික පාවාදීමේ මෙහෙවරෙහි නියුතුවනු ඇත.

## රනිල්ගේ ඉල්ලන් කෑම

දැන් රනිල්ට කරන්න තියෙන්නේ රට ඉදිරියේ හඬා වැටෙමින් මෛත්‍රීපාල ජනාධිපතිතුමාට ආඩපාලිකීම නොවේ. විධායකයේ නිර්මතෘ වු ස්වකීය මාමණ්ඩියගේ වල හාරා, ඔහු සමඟ සැතපීම මිස ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා විලාප නැගීම නම් නොවේ. ජනාධිපති ධූරයට කෙලපෙරන රනිල්ට අපිට නම් කියන්න තියෙන්නේ කුම්බල කටු කෑවනම් දුකවිඳපන් බළලෝ කියාය. රනිල්ගේ කෙරුවාව පෙනුන තවත් හොඳම සිද්ධියක් තමයි මහා බැංකු මංකොල්ලය. එහිදි හොරු හොයන්න නිතිඥ කාණ්ඩායමක් පත්කරලා, පරීක්ෂණයක් කරලා වාර්තාවක් ගෙන, වරදක් වෙලා නෑ කියලා රටටම කොලේ වැහුවා. මහා බැංකු වංචාවෙන් ආර්ථිකයට වෙච්ච හානිය ආවරණය කිරිමට වසර 30ක් වත් ගතවෙන බව මුදල් අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂකවරයෙක් වු ආර්. එම්.බී සේනානායක මහතා ඒ අලාභය ගණනය කිරීමෙන් පසු ප්‍රකාශ කලේය. රනිල් එකී අලාභයේ ආවරණ මිලද, මිලසුත්‍රයට අන්තර්ගත කොට ඊට වන්දි ගෙවීම රටේ ජනතාවගේ කරපිට පැටවීමට ක්‍රියාකල දුර්ජනයකු විය. යහපාලනය රටේ ජනතාවට දුගීබව, දරිද්‍රතාවය, උරුමකර දෙමින් ජනතාවගේ ඉහමොල සුරාකන බදු ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි. ජනතාවගේ ජිවත්විමේ අයිතිය මුලින් උදුරා දැමීමේ ආණ්ඩුකරණයක් පවත්වාගෙන ගිය රනිල්ට රාජ්‍ය බලය හිමිකරදීමට ක්‍රියාකල හැක්කේ ජනතාවට හතුරු බලවේග වලට පමණි.

රනිල් බලයට පත්වු දා සිට ආර්ථික වර්ධන වේගය 3.1% දක්වා පහත වැටුණු අතර, එය මෙරට ඉතිහාසයේ වසර 16කට පසු බරපතලම කඩාවැටිමත්, අඩුම සංවර්ධන වේගයද විය. අද රනිල්ව බලයට ගෙන ඒමට වලිකන ප්‍රජාතන්ත්‍රවාදීකාරයින්ට මේ මහා කඩාවැටීම අදාළ නොවන්නේ මන්ද?

යු.එන්.පීය විසින් රටට හදුන්වාදුන් සර්වබලධාරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔවුන්ටම පාරාවළල්ලක් වු පසු එහි ප්‍රජාතන්ත්‍රවාදී අංකොන්වල එල්ලී යු.එන්.පීය බේරාගැනිමට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින බලවේග වලට ඇති සුජාතභාවය කුමක්ද ?

## පාරාවළල්ල

1978 එකාධිපති ව්‍යවස්ථාව සම්මත කොටගෙන දැනට අවුරුදු 40කට වැඩි කාලයක් ගෙවීගියත්, එමගින් රටට අත්කරදී ඇත්තේ ආර්ථික දුගීභාවයත් හා දේශපාලන අර්බුදයකුත් පමණි. මෙරට ජාතික ආර්ථිකය බිඳදමා විදෙස් ගැති යැපුම් ආර්ථිකයක් රට තුල ක්‍රියාවට නැංවු රනිල්, බලයෙන් පහකල සැනින් ලිබරල් ආක්‍රමණිකයන්, දේශිය ජාවාරම්කරුවන්, බටහිර තනාපති ඒජන්තයින් ඉලව් ගෙදරට එන්නාක් මෙන් අරලියගහ මැදුරට සේන්දුවී රනිල් උදෙසා පෙළගැසෙනු දක්නට ලැබුණි. රාජ්‍ය පාලනයෙන් නෙරපු ලැබුවකු වෙනුවෙන් බටහිර තනාපතීන් මෙතරම් සංවේදී වු අවස්ථාවක් මීට පෙර අපට දක්නට නොලැබුණි. විදෙස් ඒජන්තයින් අරලියගහ මන්දිරයට නැවත නැවතත් වඩම්මවා, රනිල් ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ ජි.එස්.පි සහන අත්හිටවනු ලෙසත්, මෙරට ආර්ථික සම්බාධක පමුණුවා ජනාධිපති මෙල්ලකර රාජ්‍ය බලය තමන් වෙත ලබාදෙන ලෙසත්ය. මේ පසුබිම තුල ජනාධිපති රනිල් ඉවත් කිරිමට ගත් තින්දුව ප්‍රජාතන්ත්‍රවාදයත්, රටේ ජනතාවත් උදෙසා ගත් තින්දුවක් ලෙස සැලකිය යුතුව ඇත.

රනිල්ගේ මාමණ්ඩිය වු ජේ.ආර් 1980දී, දිනකට රුපියල් 05ක වැටුප් වැඩිවීමක් ඉල්ලු වැඩවර්ජකයින් ලක්ෂයක් පාරට ඇද දමා, පවුල් හාරලක්ෂයක් පමණ අසරණයින් බවට පත්කරන විට රනිල්ලාට ඊනියා ජනාධිපති බලයේ සහාසික මහිමය පෙනුනේ නැත. අනතුරුව වර්ජකයින්ට රැකියා ලබදිමේදි ද රනිල්ගේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රැකියා ලබාදීමද රනිල් ප්‍රතික්ෂේප කලේය.

## විධායකයේ ගොදුරුවීම

එවකට යු.එන්.පී යේ ප්‍රජාතන්ත්‍රවාදයේ කෙලිමඩල වුයේ ආඥාදායකත්වයේ බලයයි. ඒ මග යමින් සෝමපාල සහෝදරයා මරාදැමීය. මවුලානාට, පන්ඩිතට, ඇත්ත පුවත්පතේ කාටුන් ශිල්පි යුනුස්ට මැරයින් යොදවා පිහිවලින් ඇන්නේය.

මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර, මාදුළුවාවේ සෝභිත හිමියන්ට බෞද්ධලෝක මාවතේ කුණු කානු පල්ලේ දමාගෙන තඩිබෑවේය. ඒකාධිපති ව්‍යවස්ථාවට එරෙහිවිමේ හේතුවට ලබුදුවේ සිරිධම්ම හිමියන් වැඩවිසු ගැටඹේ රාජෝපවනාරාමය වටකොට කටුකම්බි ගැසීය. ඡන්ද අයිතිය උදුරා ගනිමින් ලාම්පු, කලගෙඩි සෙල්ලම දානවිට, ඊට විරුද්ධව පත්‍රිකා බෙදු දරම්ටිපොල රතනසාර හිමියන්ට පහරදීල අත්පත්‍රිකා උදුරාගන්නා ලදි. අමරදේවයන්ට, නන්දා මාලනීට ගුවන් විදුලිය තහනම් කෙරුනි. යු.එන්.පි ආණ්ඩුවට විරුද්ධව නඩු තින්දුවක් දිමේ හේතුවට කලු ලකී ප්‍රමුඛ මැරකල්ලිය යොදවා විනිසුරුතුමන්ලාගේ නිවෙස් වලට ගල් ගස්සවා නඩුකරයින්ට ගල්ගැසීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදයක් උදාකරදී ඇතැයි වහසීබස් දෙඩිය. ජේ.ආර් ගේ ප්‍රතිවිරුද්ධ අපේක්ෂක කොබ්බෑකඩුව මහතා හතරවැනි තට්ටුවට ඇඳගෙන ගොස් පිඩාවට පත්කල අතර, එතුමාගේ ප්‍රමුඛ ආධාරකරුවකු වු විජය කුමාරතුංග හිරේ දැමීමත්, මැතිනියගේ ප්‍රජා අයිතිය අහිමි කිරිමත් යු.එන්.පී යේ සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයයි.

රනිල්ගේ මාමණ්ඩිය සහ ජාතක කල විධායකයේ අසිපතින්ම රනිල්ගේ දේශපාලන භූමිකාවද මිහිදන් කල යුතු මොහොත එලඹ ඇති බවත්, රනිල්ලාට ප්‍රජාතන්ත්‍රවාදයක් ලබාදීමට ජනතාවට පස්ස පැත්තේ රුදාවක් ඇත්තේ නැති බවත් කිවයුතුව තිබේ.

■ ටිකිරි දිසානායක

## කවි සිතුවිලි

### ඌව වෙල්ලස්ස කැරැල්ලේ 200 වන සංවත්සරය

එඩිතර වීරවර කැප්පෙටිපොළගෙ දෙස
මද්දුම බණ්ඩාර පුතුගෙළ දුන්නු ලෙස
බලමින් ඉතිහාසෙ එඩිතර පරම රස
මම මල් පුදමි තබමින් මහ පොළොවෙ හිස

හිතබැඳී තියුණු අසිපත ගෙන කොපුව තුළ
නලියන ජාති අනුරාගෙන් පපුව තුළ
සුන්කර දැමු රට වැනසු සතුරු මුළ
එඩිතර පුතුන් පෙන්විය හෙළ රුහිරු බළ

පරසිරිතට අනුව දිවයන බල වේගේ
කෝ අපරටේ තිබු ජාතික අනු රාගේ
දුසිරිත් වලට ගැතිවී පිට රැටි යාගේ
ජාතික ඇල්ම කෝ අද සිංහල යාගේ

අපෙ රට අනාගත ගමනෙහි සරු සාර
පොදු ජන සැවොම තෝරාගමු නිසි පාර
ජයගන්නට බමුණු කුලයෙන් රට බාර
සමරමු හදෙහි බැඳී එඩිතර උප හාර

කලු පැහැ උපැස් යුවලක රුව මකන ඇසේ
රිද්මයකට අනුව තද රැළි කෙරුණ හිසේ
යන්තම් කටේ ගාගත් ඉංගිරිසි බසේ
වැදගත් කමක් පවතිද හෙළ රටක කෙසේ

රටසැම තැනම පවතී අවුලක රහස
දැක උගතුන් නොකළහොත් පිළියම් විගස
සැමගෙම අවුල්වේ දෙවි සැනසු සිරස
පවතින දහම මඳි රට කරවන පිණිස

කේ. එම්. දිස්න කුමාර බණ්ඩාර
විශ්‍රාම විදුහල්පති
මුළු දිවයිනටම සාම විනිසුරු
බණ්ඩාරවෙල

### ලක් මව අනුනවයෙන් බේරුණේය

පහළවෙ ජනවාරි අටවන දිනේය
රට ගිලගත්තෙ මාරක කොඩි විනේය
තෙවසරකට වැඩිය හෙණ පිපිරුණේය
ලක් මව අනුනවයෙන් බේරුණේය

බටහිර අධිරාජ්‍යවාදි යම පල්ලන්
සිපගෙන - වැලඳගෙන - තුරුලට අලි ගොල්ලන්
තකතීරු පාලනේ විලසට බුවල්ලන්
ලක් මැණියගේ වෙහෙසුනි රුහිරම ඉල්ලන්

ප්‍රජාතන්ත්‍රයේ කන කන මිනීවල
හුරාගෙම කන යුගයක් උදාකල
මර බිය නිසා රට වට කර මුදාහල
රීරා ඇදවැටුනි ජනතා දෙපාමුල

මහබැංකුව පටන් මුළු රට බදාගෙන
බදු දුන් කන්න මස්සිනාලට උපාදැන
මහ නිළමෙලගේ වසලත් වත දිගහැරින
ඉගුලුනි හෙනහුරා මුළු ජාතියෙ පිනට

මංගල පැතුම් අවමංගල අනේ දුක
වනරක වැසී මුව ඇරිලා අදෝ මුඛ
එම්බල තවත් පරයන් හා සෙනේ රැක
කන්නට ඉඩක් නැහැ ඇඳුමින් උපාසක

රණගල සමරසේන
ඌරු මුත්ත
අකුරැස්ස

# කෝන්තර දේශපාලනය පසෙකලා යූ.එන්.පී විරෝධී සියලු බලවේග එක පෙරමුණකින් සටන් වදිමු



■ වාසුදේව සහෝදරයා කුරුවිටදී පවසයි

**දේශපාලන අරගලයේදී කෝන්තර දේශපාලනය පැත්තකින් නොතිබ්බොත් දේශපාලනයේදී අපි පරාජය වෙන බව පසුගිය දා කුරුවිට පැවති ජන හමුවකදී වාසුදේව සහෝදරයා පැවසීය. තවදුරටත් අදහස් දැක්වූ වාසුදේව සහෝදරයා,**

කොහොමද මම මේක දන්නේ. මගේ දේශපාලන ජීවිතේ ලබපු වසර 50 අත්දැකීම් අනුවයි. මට මතකයි එදා මේරටේ හිටපු ප්‍රධාන වාමාංශික නායකයෙක් සිරිමා මැතිනියත් එක්ක කොන්තරයක් ඇති කර ගත්තා. ඒ කොන්තරය නිසා එයා යූ.එන්.පී. එකටත් එකතු වුනා. අන්තිමට ඔහු අතරමං වුනා. තමන්ගේ ආසනයත් පරාජය වුණා. ඔහු කිව්වේ මම යූ.එන්.පී එකත් එක්ක යනවා. නමුත් මම යූ.එන්.පී වෙන්නෙ නැහැ කියලා .එහෙම කිව්වට ඔහුගේ දේශපාලන ජීවිතයට ගැලවීමක් තිබුණේ නැහැ.

ඉතිහාසයේ අපටම මොකද වුණේ. 1970 සිරිමා බණ්ඩාරනායකයක මැතිණියයි, අපියි එකතුවෙලා ආණ්ඩුව හැදුවා. සිරිමා බණ්ඩාරනායක මැතිනිය අපේ ඇමැතිධුර වෙනස් කලා, (ජාත්‍යන්තර බලපෑම් උඩ) ජාත්‍යන්තරයේ බැලපෑමට. එතුමිය ඒ වෙලාවේ අපේ ප්‍රධාන ඇමැතිවරු 03 දෙනෙකුගේ නිලතල වෙනස් කලා. ඒ වෙලාවේ සමසමාජ පක්ෂයත්, අපිත්, කොමියුනිස්ට් පක්ෂයත්, නන්ද එල්ලාවල ඇතුළු ශ්‍රී.ල.නි.පයේ අය කොටසකුත්, එළියට බැහැලා ආවා. සිරිමා බණ්ඩාරනායක තනි වුනා. ඉන්පසු 1977 ඡන්දය එනකොට සිරිමා බණ්ඩාරනායක මැතිනිය එකතැනක. නන්ද එල්ලාවලලා, සමසමාජ, කොමියුනිස්ට් අපි එක පෙරමුණක. යූ.එන්.පීය එක පෙරමුනක. මොකද්ද අපිට ඒ වෙලාවෙ කරන්න තිබුනේ. සිරිමා මැතිනියත් එක්ක කථා කරලා කෝන්තර අතහැරලා නිතරග ගිවිසුමකට එන්න. එදා තිබුනු ඡන්ද ක්‍රමය තුල. නමුත් ඒක නෙමෙයි අපි කලේ. අපි සිරිමා මැතිනියත් එක්ක හැප්පී හැප්පී ඡන්ද කලා. නන්දත් පරාදයි. සරතුන් පරාදයි. මමත් පරාදයි. එන්. එම් පෙරේරත් පරාදයි. අන්න කෝන්තර දේශපාලනයේ රිසල්ට් එක. ඒ නිසා කෝන්ත්‍රර දේශපාලනයට යන්න එපා.

මොකද්ද දේශපාලනයේදී අපි සැලකීමට ගන්න ඕන. එක මතවාදය. දෙක ප්‍රධාන ප්‍රතිවිරෝධය හඳුනා ගැනීම. තුන්වැනි එක අපේ දර්ශණය. හතරවනුව දේශපාලනයේ අවස්ථායික මෙහෙයුම. මෙන්න මේවා අපි හිතට ගන්න ඕන. හැමදාම චාන්ස් එන්නේ නැහැ. චාන්ස් එක ආපුවාම චාන්ස් එක නොගත්තොත් ඊට පස්සේ වෙන්නේ පසුතැවිලි වෙන්නයි.

දර්ශනය අතින් සිරිසේන ජනාධිපතිතුමා යූ.එන්.පී දර්ශනයත් එක්ක විරුද්ධයි. මතවාදයේත් ගැටුම්. රනිල්ගේ දක්ශිනාංශික ආර්ථික වැඩපිළිවෙළට විරුද්ධයි. මේ ඔක්කෝම අපි දන්නවා. මහබැංකුව රනිල්ගේ මෙහෙය වීමෙන් කොල්ල කාපු එක ගැන ඔහු කොමිසමක් දැම්මා. මේ තමයි ගැටුම. මම කිව්වා ප්‍රතිවිරෝධය ගැන. ඔය ප්‍රතිවිරෝධය හඳුන ගන්න ඕන. ඕනම ප්‍රතිවිරෝධයක් ගිනිගන්න අවස්ථාවට එනවා. අන්න ඒ අවස්ථාවේදී අපි දැනගන්න ඕන ඒක අපි අතට ගන්න. මේකයි දේශපාලනය.

දැන් අපේ ජනාධිපති එක්ක අපේ කොන්තරය තියෙනවයි කියලා එකට මුල් තැන දුන්නොත් අපිටමයි කෙලවෙන්නේ. අපේ මිනිහා අගමැති කරගන්නයි බැරිවෙන්නේ. ඒක මතක තියාගන්න. අපේ මහින්ද අගමැති වෙච්ච හින්දා තමයි අද මේ රට බේරුණේ. එහෙම නැත්නම් මේ රට යන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නැති බෙදුනු රටක් බවට පත්වෙන මහා අවසානවන්ත අනාගතයකට බව වාසුදේව සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

■ චෛතිය ගොඩකන්ද

# ඔමේගා ලයින් වධ කඳවුරක්



ඩුනියාවේ ඔමේගා ලයින් ඇඟලුම් ආයතනයේ කාන්තා සේවකයන් 2000ක් පමණ සේවයේ නියුතුව ඇත. එම ආයතනය ලාභ උපරිම කරගැනිම අපේක්ෂාවෙන් මානව හිමිකම් උල්ලංඝනය වන අකාරයේ වධ කඳවුරක් ලෙස ආයතනය පවත්වා ගෙන යන බව වාර්තාවේ.

කාන්තාවන්ගේ ස්වාභාවික ශාරීරික ක්‍රියාකාරිත්වයන්ගෙන් මතුවන අපහසුතාවයන් නොසලකා හරින අතරම එම අවස්ථා පමා කිරිමට ඖෂධ ලබාදෙන බවද වාර්තා වෙනවා. එවැනි අවස්ථාවලදී නිවාඩු ලබානොදෙන අතර නිවාඩු ලබාගත්තොත් වැටුප් කැපිමේ අමානුෂික පියවරයන් ක්‍රියාත්මක කරනවා.

නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය ආරක්ෂක මෙවලම් නොසපයන අතර, බොහෝ දෙනෙකුගේ කන් ඇසිමේ දෝෂ මතුවී තිබේ. අවශ්‍ය පරිදි පානීය ජල සැපයුම ලබානොදෙන අතර ඒ නිසා වකුගඩු රෝගී භාවයද වාර්තා වෙමින් තිබේ. වෛද්‍ය පහසුකම්, නීතිමය ආවරණ නාමිකව පමණක් පවත්වාගෙන යන අතර සෞඛ්‍යය වෛද්‍ය සේව සැපයීම වෙනුවෙන් ප්‍රමුඛතාවය නොදී පාලකයන් කටයුතු කරති.

වවුනියාව කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ පිළිබඳව මැදිහත් නොවීම ගැටලු සහගතය. පාලකයින්ට නිෂ්පාදන ලාභ උපරිම කරගත හැකිය. නමුත් ණය ලබාදීමේදි ලංකාවේ නිති රාමුව අනුව කටයුතු කල බව අවධාරණය කරන අතර, යූ.එන්.පී පාලනය අවසන් වීමෙන් පසුව හෝ කම්කරු අමාත්‍යවරයාගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය පවතී.

■ ජයන්ත රුවන් පතිරණ

# ශ්‍රීලංකාවේ ප්‍රශ්නවලට විදෙස් මැදිහත්වීම් එපා

**හිටපු අග්‍රාමාත්‍ය අචාර්ය දි. මු. ජයරත්න**



ශ්‍රී ලංකාව තුල වර්තමානයේ ඇති වී තිබෙන තත්වයන් අවුල් කිරීමට විදෙස් අතපෙවීම් සිදු විය හැකි බැවින් සියළු දේශපාලන නායකයින් හා උගත් ප්‍රභූන් කල්පනාකාරීව කටයුතු කලයුතු බව හිටපු අග්‍රාමාත්‍ය අචාර්ය දි.මු.ජයරත්න මැතිතුමන් අවධාරණය කරයි. අද ලංකාවේ ඇති වී තිබෙන තත්වයට සමාන තත්වයන් ලෝකය වෙනත් රටවල් ගණනාවක ද ඇතිවී තිබෙන බව ද එවැනි රටවල් විනාශ කිරීමට ලෝක බලවතුන් ක්‍රියාකර ඇති ආකාරය අප විසින් සිහි තබාගත යුතු බවද ජයරත්න මැතිතුමන් පෙන්වා දෙන්නේය. ඉරාකය ලිබියාව ඊජිප්තුව සිරියාව ඇෆ්ඝනිස්ථානය වැනි රටවල් ඊට උදාහරණ බව ද ඔහු සඳහන් කරන්නේය. ශ්‍රී ලංකාව තුළ ඇති වූ ප්‍රශ්න අප විසින්ම විසඳා ගත යුතුය. විදෙස් කිසිම රටකට ශ්‍රී ලංකාවේ ප්‍රශ්නවලට අතපෙවීමට කිසිසේත් ඉඩ නොදිය යුතුය. එවැනි තත්වයක් ඇති වුවහොත් ශ්‍රී ලංකාව ද සිරියාවක් වනු ඇත. මේ තත්ත්වයන් ගැන අවංකව හා කරුණාවෙන් සිතා බලා ජාති, ආගම් බේදයෙන් තොරව අධිෂ්ඨානයෙන් ක්‍රියා කරන ලෙස සියලු දේශපාලන නායකයින් ගෙන් හා ප්‍රභූන්ගෙන් ඉල්ලා සිටින බවද හිටපු අග්‍රාමාත්‍යවරයා සඳහන් කරයි.රාම රාවණා යුගයේ පටන් 1948 දක්වා විටින් විට විවිධ බලපෑම්වලට යටත් වීමට ශ්‍රීලංකාවට සිදු වූ බවද සිහිපත් කරන ජයරත්න මැතිතුමන් මේ අවස්ථාවේදී යම් විදියක විදෙස් බලපෑම් ඇතිවුවහොත් සාමාන්‍ය ජනතාව ඊට එරෙහිව නැගී සිටින බවද එමඟින් විශාල විනාශයක් ඇතිවිය හැකි බවද පෙන්වා දෙයි. එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රශ්න විසඳාගැනීමට විදෙස් බලපෑම් වලට ඉඩ නොදී අපේ ප්‍රශ්න අප විසින්ම විසඳාගෙන දේශීය කෘෂිකර්මාන්තය හා දේශීය නිෂ්පාදන ඉහළ නංවා ස්වාධීන හා ස්වෛරී සමෘද්ධිමත් රාජ්‍යයක් ලෙස කටයුතු කිරීමට සියලු දෙනා අධිෂ්ඨාන කරගෙන කටයුතු කළ යුතු බව හිටපු අග්‍රාමාත්‍ය දිමු ජයරත්න මැතිතුමන් සඳහන් කරන්නේ ය.

■ ජයසූරිය උඩුකුඹුර

# ඇඹිලිපිටිය කඩදාසි කම්හලේ ඉඩම් කොල්ලය

ඇඹිලපිටිය කඩදාසි කම්හල වු කලි සබරගමුවට හා දකුණු පලාතට තිබුණු මහත් සම්පතකි. මෙය පිහිටා ඇත්තේ රත්නපුර දිස්ත්‍රික් මායිමත්, හම්බන්තොට මායිම් වන කදුරුගස් ආර ප්‍රදේශයේය. ඒ සෘජු හා වක්‍ර රැකියා ලාභින් 2000කට වැඩියෙන් සෙත සැලසු ස්ථානයකි. කුඹුරුවල පිදුරු උපයෝගී කරගෙන කඩදාසි නිෂ්පාදනය කිරිම මෙම ස්ථානයේ සිදුවිය. අනෙක් කම්හල පිහිටියේ උතුරු ප්‍රදේශයේ වාලච්චේන ප්‍රදේශයේය. නමුත් විවිධ දේශපාලන පක්ෂ බලයට පත්වීමත් සමඟම මෙම ආයතනය පිළිබඳ සොයා බැලිම අඩුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස කම්හල වසා දැමුණු අතර, එය 2002 වසරේ සිට ක්‍රම ක්‍රමයෙන් සිදුවිය. මේ වන විට එය පුද්ගලික බැංකුවකට සින්න වී තිබුණු අතරම පසුගිය මාසයක පමණ කාලයක සිට පුද්ගලික ආයතනයක් මෙහි වැඩකටයුතු ආරම්භ කර ඇති අතර, එහි තිබු ඉඩම් මේ වන විට අන්සතු වී ඇත. එක් කොටසක තාප විදුලි



බලාගාරයක්ද, තවත් කොටසක කෙසෙල් වගාවන්ද, තවත් කොටසක එලිමහන් සිරකදවුරක්ද, තවත් ප්‍රදේශයක් ජනතාව විවිධ වගාවන් සිදුකොට ඇති අතරම මෙහි නිරවුල් භාවය පිළිබඳව අදාල අංශවල අවදානය යොමු විය යුතු නොවේද? මුදලට හෝ යම් දේශපාලන හිතවත් කමකට මේවා යම් යම් අයගේ අතට ගොස් ඇතිද යන්න සොයා බැලීම කාලින අවශ්‍යතාවයක් යැයි ප්‍රදේශයේ ජනතාව පවසති. රජය සතුව තිබූ දේපලකට අද සිදුවී ඇති දේ පිළිබඳව බොහෝ දෙනා විමතියට පත්ව සිටින බව වාර්තාවේ.

■ ජයන්ත රුවන් පතිරණ

## අපගේ ශෝකය

වාමාංශික දේශපාලන ගමන් මඟේ, සුරියමල් ව්‍යාපාරයෙන් සටන්බිමට අවතීර්ණ වෙමින් සිටි **උපාලි නන්දසේන සහෝදරයා** සදහටම අප අතරින් වෙන්විය. අපගේ රතු ධජය අඩකුඹු කරමින් සංවේගාත්මක උත්තමාචාරය පලකරන්නෙමු.

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ තෙල්දෙනිය ප්‍ර.සා මන්ත්‍රී ආර්. අතුල සේනාරත්න සහෝදරයාගේ මැණියන්ගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය පලකරමු.

අප පක්ෂයේ මහනුවර දිසා සභාවේ දිස්ත්‍රික් භාණ්ඩාගාරික ඒ විරසිංහ සහෝදරයාගේ තණමල්විල, කුඩාඔය විසු ආදරණිය මැණියන්ගේ අභාවයට අපගේ ශෝකය පලකරමු.

**වාසුදේව නානායක්කාර සහෝදරයා ඇතුළු**
**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ**
**සහ ජනතාවාදී සන්ධානය**

## ශක්තියට ආධාර කරන්න

මුල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවිමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබාදෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන අකාරයට එවන ලෙස ඉල්ලමු.මුදල් ඇණවුම් කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකිවන පරිදි එවන්න.

**එම්.බි. සරත් පද්මදාස**
කලමනාකරු
ශක්තිය
49/1, විනයලංකාර මාවත,
කොළඹ 10.

ශක්තිය

## ඉන්ධන මිළ අඩු වීමේ වාසිය ජනතාවට ලබාදිය යුතුය

■ ජයසූරිය උඩුකුඹුර

- වෘත්තීය සංගම් ක්‍රියාකාරින් -

ඉන්ධන මිළ අඩු වීමේ වාසිය රටේ පොදු ජනතාවට ලබාදිය යුතු බව වෘත්තීය සංගම් ක්‍රියාකාරිහු රජයට පෙන්වා දෙති. ඔක්තෝබර් 26දා සිට පැවති රජය අවස්ථා දෙකකදී ඉන්ධන මිළ අඩු කල අතර වත්මන් රජය ද ඉකුත් 21දා නැවත වතාවක් ඉන්ධන මිළ අඩු කර ඇත. මේ ආකාරයට ඉන්ධන මිළ අඩු වීම නිසා ප්‍රවාහන ගාස්තු අඩු වන බැවින් බස් හා ත්‍රිවීලර් ගාස්තු ද පාරිභෝගික භාණ්ඩවල මිළ ද අඩු විය යුතු වුවද මේ දක්වා එවන්නක් සිදුව නැති නිසා රජය වහ ඊට මැදිහත් විය යුතු බව ද වෘත්තීය සංගම් පෙන්වා දෙන්නේය.

# සියලු කම්කරු බලවේග එක්ව වැඩකරන ජනතාවගේ ජාතික මහා සමුළුව ගොඩනඟමු

අතීතයේ කම්කරු පන්ති ව්‍යාපාරය කටයුතු කලේ රාජ්‍ය බලය අරමුණු කරගෙනය. නමුත් 1956දී ඇතිවු දේශපාලන පෙරලියට අනුව කම්කරු ව්‍යාපාරයට වෙනස් මඟක් ගැනිමට සිදුවිය. ඒ අනුව ප්‍රතිසංස්කරණ හා සුබසාධන කටයුතු සඳහා රාජ්‍යයන්ට බලකරමින් කම්කරු ව්‍යාපාරය ශක්තිමත් කලේය. එවකට රජය අනුමතකල ජනසතු කිරීම් ඇතුළු වමේ දේශපාලනයට හිතකර ක්‍රමවේදයක් ආරම්භ වීමත් සමඟම කම්කරු ව්‍යාපාරයද පක්ෂ දේශපාලන රාමුවකට හිර විය. මේ නිසා කම්කරු ව්‍යාපාරයේ තිබු උතුම් බලාපොරොත්තු සුණුවිසුණු විය. මේ පසුබිම තුල නව ප්‍රවණතාවකින් හා ජවයකින් තරුණ(ශිෂ්‍යය) ව්‍යාපාරය නිර්ධන පන්තිය, රාජ්‍ය බලය යනාදී මතවාදයන් සමඟ ජවිපෙ සමාජගත විය.







ප්‍රජාතන්ත්‍රවාදී දුම්රිය සේවා සේවක සංගමය සංවිධායක **ප්‍රේමලාල් පෙරේරා**

1956 පෙරලියෙන් පසු මැද මාවතක ගමන් ගත් කම්කරු ව්‍යාපාරය, ජවිපෙ ඉදිරිපත් කල නව මතවාදයන් සමඟ තිගැස්සී එක තැනක නතර වුයේ සිදුවන්නට යන්නේ කුමක්දැයි දෙගිඩියාවෙනි. එදා ජවිපෙ කම්කරු ව්‍යාපාරය හා ඊට සම්බන්ධ වුවන් හැදින්වුයේ ඉල්ලීම් පසු පස යන කැද කොප්ප සටන් කරුවන් හා එයට නායකත්වය දෙන්නන් මුට්ටි කාසි කරුවන් ලෙසය. මේ ආකාරයේ ජවිපෙ කම්කරු සංවිධාන අධෛරමත් කර, දුර්වල කර කම්කරු සටන ගොඩගැනිම දෝහිකමක් ලෙස හැඳින්විය. ජවිපෙ මෙම මර්දන වැඩපිළිවෙළට මුහුණදිය හැකි අත්දැකීම් සහිත කම්කරු පංති ව්‍යාපාරයේ දක්ෂයින් කම්කරු ව්‍යාපාරයට නව දේශපාලන දර්ශනයක් සහිත නව ගමන් මඟක් සඳහා සාකච්ඡා ආරම්භ කලේය. මේ වන විට 1976 කම්කරු අරගලය ස්වාධීනය බලවේයක් ලෙස ක්‍රියාකරමින් එවකට පැවැති රජයට දැවැන්ත අභියෝගයක් එල්ල කිරිම කම්කරු ව්‍යාපාරයේ ඓතිහාසික ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. ඉතිහාසයෙත් අපට උගන්වා ඇත්තේ කම්කරු පංතියේ ස්වාධීන ශක්තිමත් වු ගමන යටපත් කරගන්නට ඊනියා පක්ෂ දේශපාලනයට හැකිවන්නේ කෙටි කාලයකට බවය. සමාජ අර්බුදය හා ව්‍යාකුලත්වය උග්‍රවිමත් සමඟ ස්වාධීන කම්කරු පන්තියට ඉදිරියට ගමන් කිරිමට ඇති ශක්තියද, අතීත අරගල වලදී මනාව පැහැදිලි වී ඇත. කම්කරු පංතිය අලුත් ජවයකින් එසේ ගොඩනැගෙද්දී ජවිපෙ නැවත වතාවක් වැඩබිමට එක සමිතියක් යන මතය ඉදිරිපත් කලේය. එයද කම්කරුය ව්‍යාපාරයට ප්‍රයෝගික නොවුයෙන් එයද පුස්සක් විය. එහෙත් ජවිපෙ වැඩබිම් වෘත්තීය සමිති ගොඩනැගීම ආරම්භකලේ තමන්ට කම්කරු පංති දේශපාලනය පිළිබඳ අවබෝධයක් හෝ දැනුමක් නොමැති බව ලෝකයාට පෙන්වමිනි. මේ වන විට ජවිපෙ කම්කරු සංවිධාන යටපත් කරගෙන ඔවුන්ට ස්වාධීනව නැගිට කටයුතු කිරිමට ඇති මාවත විකෘති කරමින් සිටිති. මෙම තත්වය තුල සිරවී සිටින සැබෑ කම්කරු නායකයින් ඉන් මිදී මෙරටේ නිර්ධන කම්කරු පංතිය සමඟ ස්වාධීන නායකත්වයක් සඳහා උරදෙනු ඇත. එය එතරම් කාලයක් නොගොස් සිදුවනු ඇත.

මෙරටේ නිර්ධන කම්කරු පංතිය වෙනම වැඩකරන ජනතාව වෙනුවෙන් වැඩබිම් නායකයින් සැබෑ කම්කරු සහෝදරයින් පක්ෂ දේශපාලනයෙන් තොරව සමිති භේදයෙන්, ශ්‍රේණි භේදයෙන් තොරව එක්ව සංවිධාන ගත විය යුතුව ඇත. අප කැපවී සිටින්නේද ඉදිරියේ කැපවන්නේද මේ අරමුණ වෙනුවෙනි. අප සියළු දෙනා එක්ව එකීය ශ්‍රීලංකවක් තුල වැඩකරන ජනතාවගේ ජාතික මහා සමුළුව ගොඩනඟමු.



**එම්.ඩි.ආර් අතුල**
සභාපති
රාජ්‍ය මුද්‍රණ ශිල්පින්ගේ සංගමය

## කම්කරු ව්‍යාපාරය ගොඩනැගීමට පෙරමුණ ගතයුතුයි

මෙම වකවානුව ශ්‍රීලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය පිළිබඳව සතුටු විය හැකි කාලයක් නොවේ. අද වෘත්තීය සමිති බහුතරය පවතින ධනපති රාජ්‍යයන්ට සහය දැක්විමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් තම පෞද්ගලික අභිලාෂයන් වෙනුවෙන් කටයුතු කරමින් සිටිනවා. අද ඔහුන් කම්කරු පංතියේ ඇත්ත අවශ්‍යතාවය පවාදෙමින් ආත්මාර්ථකාමි වෘත්තීය සමිති ව්‍යාපාරයක් ගොඩනැගිමට කටයුතු කරමින් සිටිනවා. පසුගිය 2015 ජනාධිපතිවරනයේදි ඔවුන් විවිධ පුරවැසි සංවිධාන ගොඩනඟමින් ඩොලර් පසුපස හඹා යමින් ධනපති හා දක්ෂිණාංශික පක්ෂ නායකයින් සමඟ ගමන් කරන අයුරු පිළිකුලෙන් යුක්තව බලාසිටියෙමු. විශේෂයෙන් එජාපය ප්‍රමුඛව අන්ත ධනවාදී කම්කරු විරෝධී දේශියත්වය ගරු නොකරන පක්ෂයන්ගේ ජයග්‍රහණ වෙනුවෙන් නොගත් උත්සහයක් නැතුවා සේම, අපි එය පිලිකුලෙන් යුක්තව හෙලා දකිනවා. ඔවුන් මේවාකලේ කුමන අරමුණක් වෙනුවෙන්ද යන්න දැන් පැහැදිලියි. ලෝක කම්කරු සංවිධාන රැස්විම් නැතහොත් ජිනීවා සමුළුවලට ගොස් විශාල දිමනා සාක්කුවේ දමාගෙන ඇත. සමහරු විවිධ ආයතන වලින් වරදාන වරප්‍රසාද ලබාගෙන ඇත. ඒ අනුව පෙනී යනුයේ ඔවුන් කම්කරු පංතියේ කරපිටින් ගොස් තම පෞද්ගලික අවශ්‍යතාවයන් සපුරාගෙන ඇති බවය. තවද රාජ්‍ය සේවකයින්ගේ පරම අයිතිය වු විශ්‍රාම වැටුප කප්පාදු කරන විට නිශ්ශබ්ද්ව බලා සිටින මොහුන් නිදහස් අධ්‍යාපනය කප්පාදු කරන විට නිශ්ශබ්දව සිටිති. මොවුන් ධනපති පක්ෂ ආරක්ෂා කිරිමට නැගී සිටිම හස්‍යජනකය. එජාපයට කම්කරුවන්ට කිසිඳු අයිතිවාසිකමක් ලබාදීමට උනන්දුවක් නැත. එම නිසා මෙම පවාදෙන්නන්ගෙන් කම්කරු පංතිය ආරක්ෂා කරගැනිම අපගේ ප්‍රථම වගකිම වන අතර, පසුගිය වකවානුවේ විශ්ව විද්‍යාල තුල නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාවන් ආරක්ෂා කරගැනිමේ අරගලයේදි සහ රටට අහිතකර සිංගප්පූරු ගිවිසුම පිළිබඳව තම විරෝධය පාමින් සිදුකල අරගලයේ නායකයන්ට කම්කරු පංතියේ ස්තුතිය පුදකල යුතුය.

එබැවින් ආරාධනා කරනුයේ කම්කරු පංතියේ ඇත්ත අයිතිවාසිකම් වෙනුවෙන් කම්කරුවන්ගේ හද ගැස්ම හදුනන, කම්කරු ව්‍යාපාරයක් ගොඩනැගීම ආරම්භ කලයුතු වකවානුව එලඹ ඇති බවයි. දේශියත්වය හා දේශිය සම්පත් ආරක්ෂා කරන කම්කරු පංති එකමුතුවක් ගොඩනඟා ගනිමින් මෙම ධනපති රාජ්‍යයන්ට අභියෝග, කරමින් රටට හානිදායක අණපනත් අහෝසි කර ගනිමින් වමට හා කම්කරු පංතියට බර රජයක් පිහිටුවා ගනිමින් අහිමි කරන ලද විශ්‍රාම වැටුප ප්‍රමුඛ පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ අයිතිවාසිකම් රැකගැනිමට කම්කරු ව්‍යාපාරය ගොඩනැගීමට ඉදිරියට එන ලෙස සමස්ථ වැඩකරන ජනතාවගෙන් අප සංගමය ඉල්ලා සිටිමු.

## දක්ෂිණාංශික බලවේග වලට මුහුණදෙන නව කම්කරු සංවිධානයක් බිහිවේ

■ බුද්ධිශාන් ජයසිංහ

එළඹෙන ඕනෑම මැතිවරණයක් ඉලක්ක කරගනිමින් සහ රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එ.ජා.පල ටි.එන්.ඒ හවුල පන්නා දැමීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කම්කරුවන් එක්ව විශේෂ සංවිධානයක් පිහිටුවාගෙන ඇති බව ශක්තියට වාර්තාවේ.




ඉදිරි කාලයේදී එ.ජා.පය සහ එහි හවුල්කාර පක්ෂ රට තුල ඇති කරන අර්බුදයන් මැඩපැවැත්වීමට කම්කරුවන් සුදානම් විය යුත්තේ කෙසේද සහ ජාතින් අතර යම් නොසන්සුන්තනාවයක් ඇති වුවහොත් ඊට ගතයුතු ක්‍රියාමාර්ගයත්,ජාතික අර්බුදයන්ට පිලිතුරු සැපයිම වෙනුවෙනුත් මෙම සංවිධානය පිහිටුවා ගෙන ඇති බවත් එය "නිදහස් පොදු ජන සේවක එකමුතුව" ලෙස නම් කර ඇති බවත් වාර්තාවේ.

පසුගිය ඔක්තෝබර් 26 දින ඇතිවු මෛත්‍රී මහින්ද එකමුතුව වඩාත් ශක්තිමත් කරමින් ඉදිරියට කරගෙන යාමද මෙම සංවිධානයේ තවත් අරමුණක් වී ඇතැයිද මේ වන විට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහෝදර සහෝදරියන් විශාල පිරිසක් නිදහස් පොදු ජන සේවක එකමුතුව වටා එක්ව ඇතැයිද වාර්තා වේ.

## 2019 වැනි අයවැයට ඇඟලුම් ක්ෂේත්‍රයේ යෝජනා

■ ජයන්ත රුවන් පතිරණ




**පහත දැක්වෙන අයවැය යෝජනා කටුනායක සාමුහිකය විසින් ඉදිරි පත් කර ඇති බව වාර්තා වේ.**

- අවම වැටුප රු: 25,000/= කට ඉහළ නැංවීම.
- GSP සහනය පාලකයින්ට පමණක් නොව සේවකයි න්ටද ලැබීමට සැලසීම.
- මාස ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරිම සඳහා ලියාපදිංචි අර්ථසාධකයට නිතී පැනවීම.
- ඇඟලුම් කලාප ආශ්‍රිත ශ්‍රමිකයන්ට නිවාස අවශ්‍යතා වෙනුවන් ප්‍රතිපාදන සැපයිම හා පෞද්ගලික කුලී වාසස්ථාන.
- නියාමනයට නිති පැනවීම හා අධික්ෂණ යන්ත්‍රය සැකසීම. ඇඟලුම් කලාප ආසන්නව පහසුකම් සහිත රෝහල්, පොලිසි, කාන්තා කාර්යංශ ස්ථාපිත කිරිම.
- ක්ෂද්‍ර ණය නිසා විපතට පත් කාන්තා සේවකයින්ගේ ණය කපා හැරීම හා පොලී අනුපාත සීමා පැනවීම.

කොළඹ 10, ස්ටාර් මුද්‍රණාලයේදී මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.